# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,827 – 2013 සැප්තැම්බර් මස 06 වැනි සිකුරාදා – 2013.09.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්, (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 සැප්තැම්බර් මස 30 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 අගෝස්තු මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කොළඹ | තිඹිරිගස්යාය | කොල්ලුපිටිය කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වේල්ල වීදිය, කොළඹ 12. |

09-52

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්, (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 සැප්තැම්බර් මස 30 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 අගෝස්තු මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගම්පහ | මීගමුව | තලාහේන කොට්ඨාසයේ උප්පැන්න මරණ හා උතුරු අළුත්කුරු කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුර. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |

09-53

---


(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

### බඩු බාහිරාදිය විකිණීම්

මගේ අංකය : ඇ. ම. උ. වෙන්දේසිය 2013

**මහෙස්ත්‍රාත් අධිකරණය - ඇඹිලිපිටිය**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2013 ඔක්තෝබර් මස 05 වැනි දින පෙ. ව. 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලිඛිතව අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය 1/2කට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය මගින් කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් එම අවස්ථාවේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගන්නා ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

කේ. කේ. දිනේෂ් ලක්මල් පෙරේරා,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
ඇඹිලිපිටිය.

2013 අගෝස්තු මස 15 වැනි දින,
ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි 05**

| | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 01. | 63712/11 | එස්. පී. එස්. ඊ. 4051 අත්ට්‍රැක්ටරය |
| 02. | 58422/11 | සීෆෑන් වර්ගයේ අත් ට්‍රැක්ටරය |
| 03. | 67218/12 | අත් ට්‍රැක්ටරය |
| 04. | 78862/12 | එස්. ජී. එස්. සී. 7221 කුබෝටා වර්ගයේ අත්ට්‍රැක්ටර් එන්ජින් 01 |
| 05. | බී. ආර්. 1246/07 | 206-7307 ත්‍රිරෝද රථය |
| 06. | 77933 | චෙන්ෂෝ එකයි |
| 07. | 75885/12 | චෙන්ෂෝ 02යි |
| 08. | 83203 | චෙන්ෂෝ එකයි |
| 09. | 81665/12 | චෙන්ෂෝ එකයි |
| 10. | 74664/12 | චෙන්ෂෝ එකයි |
| 11. | ඒආර් 956/12 | නොකියා වර්ගයේ ජංගම දුරකතනය |
| 12. | ඒආර් 13/11 | සෝනි එරික්ෂන් වර්ගයේ ජංගම දුරකථනය |
| 13. | ඒආර් 529/13 | අංක අපැහැදිලි පාපැදි 02යි |
| 14. | ඒආර් 528/13 | අංක අපැහැදිලි පාපැදි 06යි |
| 15. | ඒආර් 950/13 | අංක අපැහැදිලි පාපැදි 02යි |
| 16. | ඒආර් 554/12 | ඕ. ඒ. 3700 දරන පාපැදි 01යි |
| 17. | ඒආර් 1458/11 | ඒ. එස්. ඒ. 5027 දරන නිව්ලයිට් වර්ගයේ පාපැදි 01යි |
| 18. | 86778/13 | මැණික් පතලයක් සඳහා භාවිතා කරන ලද භාණ්ඩ<br>අඟල් 4 එල් හැඩැති යකඩ බටය පුට්වැල් ගෙඩිය සහිත අඟල් 04 විශ්කම්භය සහිත දිග අඩි 29 1/2 සුදු පැහැති බට 01යි<br>අඟල් 03 විශ්කම්භය සහිත දිග අඩි 21 අඟල් 08 හෝස් බට 01යි<br>අඟල් 01 විශ්කම්භය සහිත දිග අඩි 40 සහිත අලුපාට බට එකයි<br>පුට්වැල් ගෙඩිය සහිත අඟල් 03 විශ්කම්භය ඇති දිග අඩි 25 කොළපාට බට 01යි<br>1115 වතුර මෝටර් එන්ජින් 01යි<br>4 x 4 වතුර පොම්ප 01යි<br>මැණික් ගරණ මැෂින් 01යි |
| 19. | ඒ.ආර්. 853/12 | 140-5481 සී බී 125 යතුරු පැදිය |
| 20. | අංක රහිත | වීදුරු බෝතල් තොගය |
| 21. | අංක රහිත | හිස් ප්ලාස්ටික් බූලි තොගය |
| 22. | අංක රහිත | යකඩ බැරල් තොගය |

***2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් වෙන්දේසිය සඳහා අනුමත කරන ලද කාර්යාලීය භාණ්ඩ***

| | | |
|---|---|---|
| 23. | ඡායා පිටපත් යන්ත්‍ර 01යි - | make model canon pbh 13536 |
| 24. | සී. පී. යූ. 01 - | serial No. 843453 a |
| 25. | පරිගණක මොනිටර් 01 – | arscm 5605 |
| 26. | ප්‍රින්ටර් 01 | - sr 34217 |
| 27. | යතුරු ලියන 01 - | 594767 |
| 28. | යතුරු ලියන 01 - | 547233 |

09-9

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - බිබිල**

රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපෑ නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණ නඩුකරයන්ට අදාළව නඩු භාණ්ඩ ලෙස ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍යයන් අතරින් රාජසන්තක කිරීමට යටත් වූ හා හිමිකම් නොපෑ පහත සඳහන් ද්‍රව්‍යයන් 2013 ඔක්තෝබර් මස 12 වැනි දින පෙ. ව. 10.00 සිට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

02. මෙහි සඳහන් නඩු භාණ්ඩ අතරින් යමකට හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසි දින වෙන්දේසියට එකී භාණ්ඩ ඉදිරිපත් කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කර තහවුරු කළ යුතු ය.

03. වෙන්දේසියට ඉදිරිපත්කර ඇති ද්‍රව්‍ය වෙන්දේසි දින දී වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙරාතුව අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා පරීක්ෂා කිරීමට කටයුතු කළ හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළි නොගැනෙන අවස්ථාවක දී අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එකී අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් එදින පස්වරු 6.00 ට පෙර ඉවත් කර ගත යුතු අතර, මුදලින් පමණක් ගෙවීම් කළ යුතු ය.

06. භාණ්ඩ වෙන්දේසියේ දී භාණ්ඩ ඉල්ලුම්කරන්නන්ට සිය අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත හෝ වෙනත් අනන්‍යතා සහතික පත්‍රයක් ඉදිරිපත් කිරීමට වග බලාගත යුතු ය.

ජී. ටී. එම්. යූ. සුවන්දුරුගොඩ,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
බිබිල.

2013 අගෝස්තු මස 06 වැනි දින,
බිබිල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 18558 | ලියාපදිංචි අංක රහිත ෆාම් මාස්ටර් අත්ට්‍රැක්ටරය හා ටේලරය |
| 02. | 20548 | ලියාපදිංචි අංක රහිත සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ටේලරය |
| 03. | 20279 | ලියාපදිංචි අංක රහිත සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ටේලරය |
| 04. | 20557 | ලියාපදිංචි අංක රහිත සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ටේලරය |
| 05. | 20250 | ලියාපදිංචි අංක රහිත සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ටේලරය |
| 06. | 19916 | UPSA 7834 සෙන්ෆින් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ටේලරය |
| 07. | 13513 | ලියාපදිංචි අංක රහිත යූනිමෝ එඩ්ග්‍රෝ අත්ට්‍රැක්ටරය හා ටේලරය |
| 08. | 19065 | ලියාපදිංචි අංක රහිත ෆාම් මාස්ටර් අත්ට්‍රැක්ටරය හා ටේලරය |
| 09. | 17728 | 340-2590 දරන සීෆෑන් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ටේලරය |
| 10. | 16164 | WPSF 2127 දරන යොන්ටිඕ වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ටේලරය |
| 11. | 18969 | 55-5428 දරන ලොකු ට්‍රැක්ටර් ටේලරය |
| 12. | 22802 | 36 ශ්‍රී 5542 දරන මැසිෆැගෂන් 135 ට්‍රැක්ටරය සහ ටේලරය |
| 13. | ඒ. ආර්. 93/12 | WPTP 0178 දරන ටී. වී. එස්. යතුරු පැදිය |
| 14. | ඒ. ආර්. 578/12 | 147-6376 දරන සුසුකි 90 වර්ගයේ යතුරු පැදිය |
| 15. | 16736 | 38 ශ්‍රී 4033 දරන මිට්ෂුබිසි වර්ගයේ ද්විත්ව කාර්ය වෑන් රථය |
| 16. | 11745 | ලොකු ඇලුමිනියම් මුට්ටි 02යි |

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 සැප්තැම්බර් මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 සැප්තැම්බර් මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 17. | 16736 | රිම් එක සහිත ටයර් 01යි |
| 18. | 10848 | ලීටර් 05 කරඩි 01යි |
| 19. | 10852 | ලීටර් 05 කරඩි 01යි |
| 20. | 10847 | ලීටර් 01 කරඩි 01යි |
| 21. | 12591 | කිලෝ 10 දුනු තරාදි 01යි |
| 22. | අංක රහිත | දුනු තරාදි 01යි |
| 23. | 23042 | එවරෙඩි වර්ගයේ විදුලි පන්දම් 02යි |
| 24. | 23042 | ඇලුමිනියම් වර්ගයේ මුට්ටි 01යි |
| 25. | 17727 | රොබින් වර්ගයේ වතුර මෝටර් 01යි |
| 26. | 17727 | කුබෝටා වර්ගයේ වතුර මෝටර් 01යි |
| 27. | 23042 | පිඟන් 02, නැඹිලි 01, කුඩා රාස්පාන් 01යි |
| 28. | 1090 | හිස් බියර් බහාලුම් 06යි |
| 29. | අංක රහිත | ගල් වංගෙඩි 01යි |
| 30. | අංක රහිත | අත් කියත් 03යි |
| 31. | අංක රහිත | ප්ලාස්ටික් කෝප්ප 10යි |
| 32. | අංක රහිත | පෝක් එක සමග පාපැදි බාර් 01යි |
| 33. | අංක රහිත | යකඩ පනිට්ටු කිහිපයක් |
| 34. | අංක රහිත | චාච්චු 01යි |
| 35. | අංක රහිත | ඊයම් බරු 05යි |
| 36. | අංක රහිත | කැඩුණු සින්ක් 01යි |
| 37. | අංක රහිත | ප්ලාස්ටික් බකට් කිහිපයක් |
| 38. | අංක රහිත | ප්ලාස්ටික් කළ ගෙඩි 05යි |
| 39. | අංක රහිත | බෝතල් තොගයක් |
| 40. | අංක රහිත | බූලි තොගයක් (ප්ලාස්ටික්) |
| 41. | අංක රහිත | කෑන් තොගයක් (ප්ලාස්ටික්) |
| 42. | අංක රහිත | අලවංගු කිහිපයක් |
| 43. | අංක රහිත | කැති කිහිපයක් |
| 44. | අංක රහිත | පොරෝ කිහිපයක් |
| 45. | අංක රහිත | පිහි කිහිපයක් |
| 46. | අංක රහිත | සවල් කිහිපයක් |
| 47. | අංක රහිත | උදලු කිහිපයක් |
| 48. | අංක රහිත | පීඩන ලාම්පුවක් |
| 49. | 5394 (බී. ආර්. 202/7) | පාපැදි 01යි |
| 50. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි 04යි |
| 51. | විනිසුරුතුමාගේ නිල රථයෙන් ඉවත් කළ ගෙවීගිය ටයර් 03 | |

09-23

---

**දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණය වාලච්චේන**
**අධිකරණයේ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

වාලච්චේන මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවරුණු නඩුවලින් අයිතිකරුවන් නොමැති රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් භාණ්ඩ 2013.09.28 වැනි දින පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා මෙම අධිකරණයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. මෙම නඩු භාණ්ඩ සම්බන්ධයෙන් අයිතිය කියා සිටින යම් තැනැත්තෙකු වේනම් ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම අයිතිය පිළිබඳ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.
2. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම මහජනතාවට නඩු භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.
3. අපේක්ෂිත මිල ඉල්ලීමක් ඉදිරිපත් නොවන ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.
4. භාණ්ඩ මිළ දී ගත් වහාම අදාළ මුදල ගෙවා අධිකරණ සංකීර්ණයෙන් ඉවත් කර ගත යුතු ය. ගෙවීම සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.
5. නඩු භාණ්ඩ මිල දී ගන්නා තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

එම්. අයි. එම්. රිස්වි,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණය,
වාලච්චේන.

| අංකය | නඩු අංකය | දේපළ |
|---|---|---|
| | | සවල් 01 |
| 01. | AR/13/13 | බාල්දිය 01 |
| 02. | AR/316/12 | සවල් 04 |
| | | උදැල්ල 02 |
| | | බාල්දිය 02 |
| 03. | AR/343/12 | කටු කම්බි රෝල් 02 |
| 04. | 483/ PC/11 | සවල් 02 |
| 05. | 1321/ PC/13 | පොරව 01 |
| | | විදුලි කියත 01 |
| 06. | 17244/ F/11 | පිහිය 01 |
| 07. | 18053/ PC/12 | උදැල්ල 01 |
| 08. | 19157/ F/12 | පිහිය 01 |
| | | විදුලි කියත 01 |
| 09. | 19330/ F/12 | පොරව 01 |
| 10. | 19359/ PC/12 | මේස පිහිය 01 |
| 11. | 19406/ F/12 | පිහිය 01 |
| 12. | 19407/ F/12 | පිහිය 01 |
| 13. | 19428/ F/12 | පොරව 01 |
| 14. | 19503/ PC/12 | උදැල්ල 01 |
| 15. | 19595/ F/12 | පිහිය 01 |
| 16. | 19596/ F/12 | පිහිය 01 |
| 17. | 19703/ F/12 | උදැල්ල 01 |
| 18. | 19704/ F/12 | පිහිය 01 |
| 19. | 19970/ MISC/12 | (1) අත් පොම්ප 03 |
| | | (2) පොරව 04 |
| | | (3) පාපැදි 01 (අංක 1206123) |
| | | (4) පාපැදි 01 (අංක 11123875) |
| | | (5) පාපැදි 01 (අංක 56003150) |
| 20. | 20016/ F/12 | (1) කොන්ක්‍රීට් කණු 06 |
| | | (2) පිහිය 01 |
| 21. | 20028/ PC/12 | (1) පිහිය 02 |
| | | (2) තරාදිය 01 |
| | | (3) පඩි 01 |
| | | (4) දුනු තරාදි (50Kg) 01 |
| | | (5) පාපැදි 01 (අංක PC 152457) |
| 22. | AR/05/13 | පාපැදි 01 (අංක 0010241) |
| 23. | AR/06/13 | පාපැදි 01 (අංක 69290541) |
| 24. | AR/14/13 | පාපැදි 01 (අංක 56005115) |
| 25. | AR/150/12 | පාපැදි 01 (අංක 69307001) |
| 26. | AR/196/12 | පාපැදි 01 (අංක 56072162) |
| 27. | AR/211/2012 | පාපැදි 01 (අංක 69343609) |
| 28. | AR/242/12 | පාපැදි 01 (අංකය අපැහැදිලිය) |
| 29. | AR/252/12 | පාපැදි 01 (අංක SQ 216448) |
| 30. | AR/253/12 | (1) පාපැදි 01 |
| | | (2) පාපැදි 01 |
| 31. | AR/266/11 | (1) පාපැදි 01 |
| | | (2) කලය 01 |
| | | (3) තාච්චි 02 |
| | | (4) තෝසගල් 01 |
| | | (5) ජංගම දුරකථන 01 |
| 32. | AR/315 | පාපැදි 01 (අංක 69548482) |
| 33. | AR/371/12 | පාපැදි 01 (අංක GN 07993-01) |
| 34. | AR/426/12 | පාපැදි 01 (අංක 420825) |
| 35. | B/41/2007 | පාපැදි 01 (අංක 5574743) |
| 36. | B/300/2007 | පාපැදි 01 (අංකය අපැහැදිලිය) |
| 37. | B/454/09 | පාපැදි 01 (අංක ED 73055) |
| 38. | B/504/09 | කරත්ත 01 |
| 39. | 5485/ PC/05 | පාපැදි 01 |
| 40. | 7587/ PC/08 | (1) පාපැදි 01 |
| | | (2) පාපැදි 01 |
| | | (3) ජංගම දුරකථන 01 |
| 41. | 7896/ PC/08 | පාපැදි (අංකය අපැහැදිලිය) |
| 42. | 17336/ PC/12 | පාපැදි 01 (අංක CC 970 AA ) |
| 43. | 17951/ PC/12 | පාපැදි : |
| | | (1) LU - 35614 |
| | | (2) 402 X 2368 |
| | | (3) 69273250 |
| | | (4) 69261691 |
| | | (5) H 5546939 |
| | | (6) A 4J05511 |
| | | යතුරු පැදි : |
| | | Kinetic |
| | | එන්ජින් අංක GJ 51008778 |
| | | චැසි අංක GJ 51008945 |
| 44. | 18641/ F/12 | පාපැදි (අංකය අපැහැදිලිය) |
| 45. | 18649/ F/12 | පාපැදි 01 |
| 46. | 18753/ F/12 | පාපැදි 01 |
| 47. | 19494/ PC/12 | පාපැදි 01 |
| 48. | 20029/ PC 12 | පාපැදි 01 (අංක 55968333-01) |
| 49. | 20387/ F/13 | කරත්තය (කැඩී ඇත) |
| 50. | 21086/ F/13 | පාපැදි (අංක 69548240) |
| 51. | 21087/ F/13 | පාපැදි (අංක 55517624) |
| 52. | 21088/ F/13 | පාපැදි (අංක 69297212) |
| 53. | AR/191/09 | යතුරු පැදි |
| | | Hero Honda CD Down |
| | | (1) එන්ජින් අංක 05L27E12667 |
| | | (2) චැසි අංක 05L27F10494 |
| 54. | AR/425/11 | යතුරු පැදි |
| | | Dukar |
| | | (1) එන්ජින් අංක DJ150FMG*03010 |
| | | (2) චැසි අංක 1403 * |
| 55. | 10590/ E/09 | යතුරුපැදි |
| | | Loncin LX 48Q |
| | | (1) එන්ජින් අංක LC 139FMA*DD158591 |
| | | (2) චැසි අංක LLCLXA10351B82810* |
| 56. | 11127/ PC/10 | යතුරු පැදි |
| | | Hero Honda CD 100 |
| | | (1) එන්ජින් අංක 04C27E34873 |
| | | (2) චැසි අංක 97HIOFO5303 |
| 57. | 14934/ F/11 | අත් ට්‍රැක්ටර් ටේලර් පෙට්ටිය |
| 58. | AR/47/2011 | යතුරු පැදි 01 |
| | | L ML Freedom |
| | | එන්ජින් අංක E 55 TK 341774 |
| | | චැසි අංක C 7JL 372577 |
| 59. | AR/50/2011 | යතුරු පැදි 01 |
| | | Yamaha MAD 50 |
| | | එන්ජින් අංක නැත |
| | | චැසි අංක V 50 - 1239159 |
| 60. | නඩු අංක නොමැත | හිස් බෝතල් |
| 61. | නඩු අංක නොමැති | බැරල් 11 |
| 62. | නඩු අංක නොමැති | සිවිලින් ෆෑන් 02 |

09-24

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**
2014 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2014 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද පහත සඳහන් කොන්දේසිවලට ද යටත්ව 2013.09.27 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත්වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියකින් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි මත ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුම් අංකය සහ නම ද පැහැදිළිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්‍රවල පළකරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන්ගේ සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2013.09.27 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

කිසියම් කරුණක් සඳහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාව හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් සතු වේ.

පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2013.11.22 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

මේ වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එකී ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණුම් දින ප.ව. 2.00ට පෙර දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලින් මාස දෙකක රේන්ද මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ඔහුට ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එච්. එම්. එල්. එස්.හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
දිවුලපිටිය.

2013 අගෝස්තු මස 15 වැනි දින,
දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනුක්‍රමික අංකය | තැබෑරුම් නම සහ අංකය | කොට්ඨාසය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල් රු. | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | දාගොන්න 27 | දිවුලපිටිය | දාගොන්න | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 4,000 | 2013.09.27<br>පෙ.ව. 10.30 |

09-16

---

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නම : එන් ඇන්ඩ් එන් මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 85368
ලියාපදිංචි කාර්යාලය : අංක 210 -7/1, 212-7/1, 7 වැනි මහල, කෙලින් වීදිය, කොළඹ 11
ලියාපදිංචි දිනය : 2012.04.04

සමාගමේ ලේකම්වරු.

09-35

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි අංක පීබී 3808 දරන අංක 14 හෝර්ටන් ටවර්, අංක 16, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08 යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලක් සවිය ෆවුන්ඩේෂන් ලිමිටඩ් 2013 අප්‍රේල් මස 12 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි යා වේ හෝල්ඩිංස් ලිමිටඩ් ලෙස සමාගම් නාමය වෙනස් කර ඇති බවට කරනු ලබන දැනුම් දීමයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

09-25

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

මට්ටක්කුලිය, සාන්ත මේරි පටුමග, අංක 27 යන ලිපිනයේ පදිංචි ෆස්ලුල්ලා ෂරීෆ් හිදයතුල්ලා ෂරීෆ් වන මම, කොළඹ 14, ශාන්ත ජෝශප් වීදිය, අංක 150 යන ලිපිනයේ පදිංචි විජය බශ්කර් කරුනාකරන් යන අයට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එච්. ටී. පී. රුවන් කුමාරි විසින් ලියා සහතික කළ අංක 148 හා 2011 අප්‍රේල් මස 12 දිනත් දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මා වෙනුවෙන් ක්‍රියා කිරීමට දී තිබූ විශේෂ ඇටර්නි බලපත්‍රය මෙම දැන්වීමේ පටන් බලපැවැත්වෙන පරිදි අවලංගු කොට බල රහිත කරන ලද බවත් එහි කිසිම වලංගු භාවයක් නොවන බවත් මෙයින් දැනුම් දෙමි.

මෙයට,
ෆස්ලුල්ලා ෂරීෆ් හිදයතුල්ලා ෂරීෆ්.

09-42

---

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.
සමාගමේ නම : නව ලංකා දේපළ (ප්‍රයිවට්) ලිමිටඩ
අංකය : පීවී 93675
ලියාපදිංචි කාර්යාලය : අංක 146, සුපර් මාර්කට්, අම්බලන්තොට.
ලියාපදිංචි දිනය : 2013.07.19

ලේකම්.

09-41

---

**දැන්වීමයි**

පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට, 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මම මෙයින් දැනුම් දෙමි.
නම : ලයිෆ්ස්ටයිල් රෙක්‍රියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 94000
සංස්ථාපනය කළ දිනය : 2013 අගෝස්තු 08 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 45, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.

අධ්‍යක්ෂ.

09-40

---

**මහජන දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ප්‍රදීප් ඇග්රෝ මාර්ට් රයිස් මිල්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2013 ජූලි මස 17 වැනි දින සංස්ථාපනය කරන ලදී.
සමාගමේ නම : ප්‍රදීප් ඇග්රෝ මාර්ට් රයිස් මිල්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 93610
ලියාපදිංචි ලිපිනය : සාලිය මාවත, අනුරාධපුර

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8 244 495/077 8 197 041
09-38

---

**මහජන දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඩෙල්මෝ ලංකා මාර්කටිං (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2013 අගෝස්තු මස 08 වැනි දින සංස්ථාපනය කරන ලදී.
සමාගමේ නම : ඩෙල්මෝ ලංකා මාර්කටිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 93982
ලියාපදිංචි ලිපිනය : අංක 197, කේසර් වීදිය, කොළඹ 11.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8 244 495/077 8 197 041
09-39

---

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.
සමාගමේ නම : ලක්වින්ටා (පී. වී. ටී.) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 81628
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 4/6, ඇස්කන් රෙසිඩන්සීස්, අංක 608, බේස්ලයින් පාර, කොළඹ
සමාගම ලියාපදිංචි කළ දිනය : 2011.09.30.
09-20

---

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කළ බව නිවේදනය කිරීම.
සමාගමේ නම : ඇලු කේ ඇලුමිනියම් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 83289
ලියාපදිංචි කාර්යාලය : අංක 226, අවිස්සාවේල්ල පාර, වැල්ලම්පිටිය.

සමාගම් ලේකම්.

09-19

---

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ යොෂිඩාෂා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2013ක් වූ පෙබරවාරි මස 28 වැනි දින ලියාපදිංචි කරන ලදී.
සමාගමේ නම : යොෂිඩාෂා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91265
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : සුමති කෝට්, අංක 491, ගාලු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,
කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

09-73

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ එස්. ඒ බී ආර් කන්ට්‍රෝල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2013ක් වූ මාර්තු මස 27 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : එස් ඒ බී ආර් කන්ට්‍රෝල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91756
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 21/12, පාගොඩ පාර, නුගේගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,
කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

09-72

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ
සමාගමේ නම : මිඩ්ල් ඊස්ට් රෙස්ටොරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92441
සංස්ථාගත කළ දිනය : 2013 මැයි මස 10 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 11, පික්රෝ ගාඩන්ඩ්ස්, මත්තේගොඩ, කොට්ටාව.

ඕ. ඕ. බි. අල්හසාන්,
අධ්‍යක්ෂ.

09-71

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම
සමාගමේ නම : කේ. ඩී. අයි. ඇළුමිනියම් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය හා දිනය : PV 80283, 2011.07.27
කාර්යාල ලිපිනය : අංක 100, පාමංකඩ පාර, කොළඹ 06.

ලේකම්.

09-69

---

### ඇටර්නි බලය අවලංගු කිරීමයි

ගැටහැත්ත, රත්නපුර පාර අංක 878 දරන ලිපිනයේ පදිංචි (ජා. හැ. අංක 531261399 වී හිමි) හේවාගමගේ සෝමදාස වන මට රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ඇටර්නි බලපත්‍ර ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර පොතේ 105 කාණ්ඩයේ 16 පත්‍රිරුවේ 6701 දිනපොත් අංකය යටතේ 2012.09.20 දින ලියාපදිංචි කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. කුමාරසිරි කලටුවාව ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් ලියා සහතික කරන ලද අංක 129 සහ 2012.08.21 වැනි දිනැති ඇටර්නි බලපත්‍රයෙන් ශ්‍රී ලංකාවේ අවිස්සාවේල්ල මාදොල අංක 73/4 දරන ලිපිනයේ පදිංචි වික්‍රමආරච්චිලාගේ හිරාන් ප්‍රසන්න වික්‍රමආරච්චි වෙත පවරනු ලැබූ ඉහත කී ඇටර්නි බලය මෙයින් අවලංගු කොට නිෂ්ප්‍රභා කරන බවත්, මෙහි සඳහන් දිනයට පසුව එළඹෙන දිනයක මා වෙනුවෙන් ඉහත කී ඇටර්නි බලලාභී මෙම කරුණට අදාළව කරන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් වගකීමට මා බැඳී නොසිටින බව ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

හේවාගමගේ සෝමදාස.

09-68

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගමේ සංස්ථාපනය කිරීම පිළිබඳව දැනුම් දීමයි
සමාගමේ නම : වින්බ්‍රිඩ්ජ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 14, කාසල් වීදිය, කොළඹ 04
සමාගමේ අංකය : පී වී 93680
ලියාපදිංචි කළ දිනය : 2013.07.19

සී. ඒ. එස්. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

09-113/1

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගමේ සංස්ථාපනය කිරීම පිළිබඳව දැනුම් දීමයි
සමාගමේ නම : රෙඩ් බර්ඩ් ඒවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 14, කාසල් විදිය, කොළඹ 04
සමාගමේ අංකය : පී වී 93386
ලියාපදිංචි කළ දිනය : 2013.07.04

සී. ඒ. එස්. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

09-113/2

---

### සින්ග්ලික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

පී. වී. 77090

අවසන් මහ සභා රැස්වීම සහ සමාගම විසුරුවා හැරීමේ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 331 (2) වගන්තිය යටතේ සෑහීමකට පත්වීමෙන් අනතුරුව ගණන් බේරා වසා දැමීමට යටත් සමාගමේ ගිණුම් සහ පහත දක්වන අනෙකුත් දේ සම්බන්ධයෙන් පවත්වන මහ සභා රැස්වීම 2013 ඔක්තෝබර් මස 29 වැනි දින පස්වරු 4.00 ට කොළඹ, රාජගිරියේ, කළපළුවාව, අංක 309 බී හි ඇන්ඩෲ ස්මිත්ස් පාර්ට්නර්ස්හි රැස්වීම් මැදිරියේ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

01. සමාගම ඈවරකිරීමේ කටයුතු සිදුකළ ආකාරය;
02. සමාගමේ වත්කම් උපලබ්දි කළ ආකාරය; සහ
03. අදාළ අනෙකුත් විස්තර ලබා දීම සම්බන්ධයෙන්.

ඒ. පී. එස්. ජයතුංග,
ඈවරකරු.

2013 අගෝස්තු මස 20 වැනි දින.
09-119/1

---

### නිවේදනයයි

ෆාබෙන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

(පී වී 7175)

**යෝජිත ප්‍රකාශිත මූලධන අඩුකිරීම**

සම්පූර්ණයෙන් ගෙවීම් කරන ලද සාමාන්‍ය කොටස් 75,004 කින් නියෝජනය වන රු. 1,000,000ක් වූ සමාගමේ ප්‍රකාශිත මූලධනය 2007 අංක 07 දරන සමාගම් පනතේ 59 වැනි වගන්තිය අනුව සාමාන්‍ය කොටස් 75,004කින් නියෝජනය වන රු. 750,040 දක්වා අඩුකළ යුතු බවට සිය කොටස්කරුවන් වෙත නිර්දේශ කිරීමට ෆාබෙන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත ප්‍රකාශිත මූලධනය අඩුකිරීම සම්බන්ධයෙන් විශේෂ යෝජනා සම්මුතියක් මගින් කොටස්කරුවන්ගේ කැමැත්ත ලබාගැනීම සඳහා 2013 ඔක්තෝබර් මස 19 වැනි දින අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවනු ලැබ ඇත.

ෆාර්බේන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
අධ්‍යක්ෂ මණ්ඩලය

09-122

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1. සමාගමේ නම : අයි. අයි. ටී. ඉන්ටර්නැෂනල් ලිමිටඩ්
2. අංකය : පී බී 5130
3. ලියාපදිංචි කළ දිනය : 2013.08.15
4. ලියාපදිංචි ලිපිනය : අංක 104, කිතුල්වත්ත පාර, කොළඹ 08.

එච්. එම්. ඊ. ඩී. එච්. කුඹුරුලන්ද,
සමාගමේ ලේකම්.

නීතිඥ සමාගමේ ලේකම්,
අයි. අයි. ටී. ඉන්ටර්නැෂනල් ලිමිටඩ්.
09-136

---

### සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 යටතේ කරනු ලබන දැනුම් දීමයි

ආයතනයේ නම : සිස්මාට් හෝල්ඩින්ස් ප්‍රයිවට් ලිමිටඩ්
ආයතනයේ අංකය : පී. වී. 94016 දිනය : 2013.08.12
ආයතනයේ ලියාපදිංචි ලිපිනය : අංක 218/3 ඒ, රත්මල්දෙනිය, පන්නිපිටිය

බිස්නස් මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.
2013 අගෝස්තු මස 14 වැනි දින.

09-129

---

### සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (02) ඡේදයේ ප්‍රතිපාදනයන්ට අනුකූලවයි

පැලියගොඩ, මීගමුව පාරේ, අංක 111 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටි ලියාපදිංචි අංක පී වී 14446 දරන වැලිගම කේප් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම 2013 ජුලි මස 31 වැනි දින සිට තම සංස්ථාපන නාමය කේප් වැලිගම (පීවීටී) එල්ටීඩී යනුවෙන් වෙනස් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

අංක : SEC/594/91.
09-128

---

### පොදු නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 08 ඡේදයේ නියමයන්ට අනුකූලව "හේලීස් ඉලෙක්ට්‍රොනික්ස් රීටේලින් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" නාමය "ග්ලෝබල් කන්සියුමර් බ්‍රෑන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" වශයෙන් වෙනස් කළ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.
සමාගම කලින් හැඳින් වූ නාමය : හේලීස් ඉලෙක්ට්‍රොනික්ස් රීටේලින් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගම් අංකය : PB 717 PV
ලියාපදිංචි කාර්යාලය : අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10
සමාගමේ නව නාමය : ග්ලෝබල් කන්සියුමර් බ්‍රෑන්ඩ්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,
හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10
2013 අගෝස්තු මස 21 වැනි දින.
09-140

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 : 1 වගන්තිය අනුව දැනුම් දීමයි
සමාගමේ නම : සී සී එල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 73704
ලියාපදිංචි ලිපිනය : අංක 93/1ඒ, 1/1, මැනින් පෙදෙස, වැල්ලවත්ත
ලියාපදිංචි දිනය : 2010.08.11

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

09-138/1

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 : 1 වගන්තිය අනුව දැනුම් දීමයි
සමාගමේ නම : සී සී එල් එක්සිකියුටිව් සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 60933
ලියාපදිංචි ලිපිනය : අංක 93/1ඒ, 1/1, මැනින් පෙදෙස, වැල්ලවත්ත
ලියාපදිංචි දිනය : 2007.08.07

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

09-138/2

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

මීගමුව දිසා අධිකරණයේ දී ය
රණපතිගේ ප්‍රේමදාස රණසිංහ
අංක 24, පළමුවෙනි හරස්වීදිය, මීගමුව

නඩු අංකය :
3445/උකස්/2010

.............................පැමිණිලිකරු.

*එදිරිව*

දර්නගමගේ දොන් කැලිස්ටස් අප්පුහාමි
අංක 355, සෙල්ලකන්ද පාර,
මහහුණුපිටිය, මීගමුව.

.........................විත්තිකරු.

මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාවට අනුව ඉහත විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයකර ගැනීමට ඇති රු. 5,75,00 ක මුදලක් ද, එම මුදල ගෙවා නිමවන තෙක් 2010.09.14 වැනි දින සිට රු. 5,00,000 ක මුදලට 3% ක මාසික පොලිය ද, අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ විස්තර වන නිශ්චල දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට අධිකරණය විසින් නියෝග කර ඇති බැවින් එම මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ විස්තර වන ප්‍රමාණයෙන් පර්චස් 07ක් විශාල නිශ්චල දේපළ 2013 ඔක්තෝබර් මස 01 වැනි දින පෙ. ව. 11.00 ට එකී දේපළ පිහිටි මීගමුව, සෙල්ලකන්ද පාර, අංක 355 දරන ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය* .- මීගමුව කොප්පරා හංදියේ සිට දිවුලපිටිය පාරේ ගොස් වමට ඇති සෙල්ලකන්ද මාවතේ ටික දුරක් ගිය විට දකුණු පැත්තට ඇති ඉඩමේ අවසානයට ම මෙම ඉඩම් කොටස පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් මුදල් සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිකරු වන මා වෙත ගෙවිය යුතු ය. සියලුම ගෙවීම් මුදලින් හෝ බැංකු අණකරයකින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

01. මුළු ගැණුම් මිළෙන් සියයට විසිපහක (25%) මුදලක්, ඉතිරි සියයට හැත්තෑපහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

02. වෙන්දේසිය ප්‍රසිද්ධියට පත් කිරීමේ *ගැසට්* නිවේදනය, පුවත්පත් දැන්වීම් ඇතුලු වෙන්දේසිය ප්‍රසිද්ධියට පත් කිරීමේ සියලුම වියදම් ද, විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නීතිඥ ගාස්තු ඇතුළු සියලුම ප්‍රචාරක වියදම් ද, ලිපිකරු හා සෝෂක ගාස්තු ද,

03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල සියයට දෙකහමාරක් (2 1/2%),

04. පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු මුළු ගැණුම් මුදලෙන් 1% ක වෙළඳ බද්ද.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් අළුත්කුරු කෝරළේ දූනගහ පත්තුවේ මහහුණුපිටියේ පිහිටි මිල්ලගහවත්ත, මූණමල්ගහ හෙවත් මදටියගහකුඹුර නමැති ඉඩමට 2008.01.29 වැනි දින ඩී. ප්‍රසාද් විමලසේන බලයලත් මිනින්දෝරු තැන මැන සාදන ලද අංක 6751 දරන සැලැස්ම ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 01 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : අඩි 10ක් පළල පාර ( අංක 875 පිඹුරේ ලොට් 7) ද, නැගෙනහිරට : නිලානි දුලිකා හාමිනේගේ ඉඩම ද , දකුණට : අංක 875 පිඹුරේ ලොට් 2 ද, (ඩී. ජී. ආර්. අප්පුහාමිගේ ඉඩම) සහ බස්නාහිරට ලොට් 02 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් හතක් (අ. 0 රූ. 0 පර්. 7) හෙවත් හෙක්ටයාර් 0.0177 ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් වේ. එහි ලියාපදිංචිය මීගමුව ඊ 1028/17 හී ය. තව ද, 1993.08.03 වැනි දින ඩී. ප්‍රසාද් විමලසේන මිනින්දෝරුතැන සාදන ලද අංක 675 දරන ලොට් 7 දරන බිම් කොටස පොදුවේ පාරක් ලෙස පාවිච්චි කිරීමේ මාර්ග පරවශතාවය ද සමග වේ.

*ඉඩම පිළිබඳ දැන ගැනීමට* .- ආර්. ප්‍රේමදාස රණසිංහ මහතා - දුරකථන අංකය : 0776422680

එන්. ජේ. එදිරිසිංහ,
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

2013 අගෝස්තු මස 22 වැනි දින දී ය,
අංක 244, පරණ කොට්ටාව පාර,
ඇඹුල්දෙනිය, නුගේගොඩ.
දුරකථන අංකය : 0777 - 453463.
09-111

---

### මහජන බැංකුව - ජාඇල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ජාඇල ප්‍රාදේශීය සභා බල සීමාවේ ඒකල පිහිටි ගාල්ල එස්ටේට් නමැති (අක්කර 0, රූඩ් 0, පර්. 10) පර්චස් දහයක් විශාල ඉඩම සහ වැඩ නිම නොකළ නිවස මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2013.09.26 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ *ගැසට්* පත්‍රයේ 2012.11.23 දින ද, ඩේලි නිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2013.05.09 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - ජාඇල, ඒකල පාරේ, ජා-ඇල හංදියෙන් ඒකල දෙසට කි. මී. 1.0 පමණ ගිය විට වම්පස ඇති රජ මාවත හමුවේ. එම පාරේ කි. මී. 1.25 පමණ යන විට හමුවන දෙහිආගාත පාරේ මීටර් 100 ක් ගොස් වම්පසට වැටී ඇති පාරේ මීටර් 135ක් පමණ යන විට අදාළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත, මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත්, දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.
දුරකථන අංකය : 033-2222325,
ෆැක්ස් අංකය : 033-2226165, 033- 2226741.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්.
වසර 121 ක සේවා විශිෂ්ඨත්වය සමගින්

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1892.com.
වෙබ් අඩවිය :www.sandslanka.com

09-109

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කොට්ටාව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2010.06.29 දිනැති සහ අංක 5875 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම කපිල අසන්ත කුමාරසිරි මාතරගේ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013ක් වූ සැප්තැම්බර් මස 25 වැනි දින ප. ව. 3.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.*- බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම කීනගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද 1961.06.28 වැනි දිනැති අංක 680 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 22 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි සහ සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 20.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.08.19 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.08.16 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - හෝමාගම නගරයේ සිට අවිස්සාවේල්ල පාරේ, සම්පත් බැංකුව දක්වා මීටර් 100ක් පමණ ගොස් එතැනින් වමට හැරී, මීටර් 50ක් පමණ පළමු පටුමගේ ගමන් කළවිට අදාළ දේපළට ළඟාවිය හැක. එය මේ පාරේ දකුණත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
ෆැක්ස් අංකය : 0112- 345975.
09-121

---

### සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කෙරෙන විකිණීම පිළිබඳ දැන්වීම

යූ. ඩබ්ලිව්. දේවසුරේන්ද්‍ර.
ගිණුම් අංකය : 0010 5000 4429.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ 1998 ජනවාරි මස 29 වැනි දින සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලදුව, 1998 අප්‍රේල් මස 03 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 1999 අප්‍රේල් මස 12 වැනි දින "දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකරන්" යන පුවත්පත්වල පළ කරන ලද යෝජනා සම්මතය ප්‍රකාර රුපියල් හාරලක්ෂ අනූනවදහස් දෙසිය හැටකුත් ශත හැට එකක් පමණක් (රු. 499,260.61) වූ මුදල සහ 1996 ජූනි මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා තවදුරටත් රුපියල් දෙලක්ෂ පණස් දහසක්

(රු. 250,000) සඳහා වර්ෂයකට 24% බැගින් වූ පොලිය ද, ප්‍රචාරක වියදම් සහ දරා ඇති වෙනත් ගාස්තු ද, ඉන් පසුව යම් මුදලක් ගෙවා ඇත්නම් ඒ මුදල අඩුකොට අයකර ගැනීම සඳහා, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, 2013.09.26 වැනි දින පෙ. ව. 11.30 ට කොළඹ, ප්‍රසිද්ධ වෙන්දේසිකාර පී. කේ. ඊ. සේනාපති මහතා විසින්, ඒ දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ. මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, නාඔටුන්න ග්‍රාමයේ පිහිටි අලවත්ත නමැති ඉඩමේ, මාතර දිසා අධිකරණයේ අංක පී/5543 දරන බෙදුම් නඩුවට ගොනුකර තිබෙන බලයලත් මිනින්දෝරු එන්. පී. කුඩාහෙට්ටි විසින් මැන සාදන ලද අංක 1942 හා 1970.12.02 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස සළකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : මෙම ඉඩමේ ලොට් අංක 3 දරන කට්ටිය ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් අංක 1 දරන කට්ටිය ද, දකුණට : පාර ද, බස්නාහිරට : පාර සහ අඩි පාරක් සඳහා වෙන් කර තිබෙන මෙම ඉඩමේ ලොට් අංක 7 දරන කට්ටිය ද, යන මායිම් ඇතුළත පර්චස් දහහතරකුත් දශම අටයි අටක් (අ. 0 රූ. 0 පර්. 14.88) විශාලත්වය ඇති බිම් කට්ටියේ බිම සහ එහි පිහිටි හා මතු ඉදිකරනු ලබන ගොඩනැගිලි සහ වැවිලි ද වේ. මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 379/101 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. සුදර්ශන්,
සමූහ සමාගමේ ලේකම්.

09-123

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (පාලවි සී එස් පී ශාඛාව)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද වර්ෂ 1978ක් වූ ජුනි, ජූලි සහ අගෝස්තු ලෙස දින දරන පිඹුරු අංක 434 හි දැක්වෙන වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත ලියාපදිංචි කොට්ඨාසය තුළ උතුරු පිටිගල් කෝරළේ ආනවිලුන්දන් පත්තුවේ හලාවත මහ නගර සභා සීමාවන් තුළ කොළඹ පාර (වම) හි වරිපනම් අංක 109/119 දරන මයික්කුලමවත්ත නම් වූ ඉඩමේ පලාවි අංක 84 දරන (අ. 0 රූ. 0 පර්. 20) සහ දැන් නැවතත් බලයලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩන්ස්ටන් පෙරේරා විසින් සාදන ලද වර්ෂ 2011 ක් වූ ජූලි මස 25 වැනි දින දරන පිඹුරු අංක 7109 හි ලොට් අංක 1 ලෙස දක්වා ඇති
පර්චස් දහඅටයි දශම හයයි හතක්
(අ. 0 රූ. 0 පර්. 18.67)

2. බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද වර්ෂ 1978 ක් වූ ජුනි, ජූලි සහ අගෝස්තු ලෙස දින දරන පිඹුරු අංක 434 හි දැක්වෙන පෙර කී හලාවත මහ නගර සභා සීමාවන් තුළ වරිපනම් අංක 109/119 (වම) දරන මයික්කුලමවත්ත නම් වූ ඉඩමේ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් අංක 85 දරන (අ. 0 රූ. 0 පර්. 20) සහ දැන් නැවතත් බලයලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩන්ස්ටන් පෙරේරා විසින් සාදන ලද වර්ෂ 2011ක් වූ ජූලි මස 25 වැනි දින දරන පිඹුරු අංක 7108 හි ලොට් අංක 1 ලෙස දක්වා ඇති
පර්චස් දහඅටයි දශම හයයි හතක් විශාල ඉඩම
(අ. 0 රූ. 0 පර්. 18.67)

වලවේ දූරගේ චානක විරාජ් කුමාර සහ හෙට්ටිආරච්චිගේ සංජීවනි චන්දන දිපානි පෙරේරා ණයකරුවන් ලෙස ද වලවේ දූරගේ චානක විරාජ් කුමාර උකස්කරු ලෙස ද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2013 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින පෙ. ව. 11.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.07.05 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2013.07.08 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2013.09.06 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2013.09.09 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* හලාවත නගරයේ සිට කොළඹ පාරේ මීටර් 250ක් පමණ ගොස් වමට හැරුණු විට ඩග්ලස් ප්‍රනාන්දු මාවත හමුවේ. එම මාවතේ මීටර් 200ක් පමණ ගිය විට අදාළ දේපළ වම්පසින් සපුමල් පෙදෙසේ 2 වැනි පටුමගේ ඉදිරිපසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ පලවි ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධි විධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තර* | *පිහිටීම* | *දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද* |
|---|---|---|---|---|---|
| 1441 | 2013.08.08 | ශාන්ත ආනා දේවස්ථානය සන්තානාපුර ලුනුවිල | පුත්තලම | ගරු අරෝෂ් ප්‍රියංග අප්පුහාමි පියතුමා | රෝමානු කතෝලික |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 අගෝස්තු මස 16 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,

09-49

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

**යාපනය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව**
2011 වසරෙහි දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා වන මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රකාශනය

| | *2011 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා රුපියල්* | *2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා රුපියල්* |
|---|---|---|
| මෙහෙයුම් ආදායම | | |
| පුනරාවර්තන ප්‍රතිපාදන | 773,652,193.00 | 536,400,000.00 |
| ශුද්ධ ආදායම/(අලාභ) අනෙකුත් ක්‍රියාකාරකම්වලින් | 3,172,426.56 | 11,591,454.90 |
| අනෙකුත් ආදායම් | 16,254,026.63 | 16,807,744.67 |
| පොදු සංචිතයෙන් ලද අරමුදල් | | 119,000,000.00 |
| | **793,078,646.19** | **683,799,199.57** |
| ශිෂ්‍යයන් සඳහා මූල්‍යමය ආධාර | 80,990,000.00 | 71,643,050.00 |
| | **874,068,646.19** | **755,442,249.57** |
| මෙහෙයුම් වියදම් | | |
| සේවක පඩිනඩි/පාරිශ්‍රමික | 637,669,183.15 | 546,416,968.88 |
| ප්‍රවාහන | 3,672,777.13 | 4,731,035.48 |
| සැපයුම් සහ පාරිභෝජන භාවිතය | 35,501,631.80 | 29,783,040.35 |

| | 2011 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා රුපියල් | 2010 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා රුපියල් |
|---|---|---|
| නඩත්තුකරණය | 11,239,188.24 | 10,169,353.81 |
| ගිවිසුම්සහගත සේවා | 67,048,118.88 | 49,900,466.66 |
| පර්යේෂණ සහ සංවර්ධන | 356,127.99 | 142,314.10 |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම් | 80,060,329.74 | 86,036,142.70 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 17,533,701.33 | 31,076,835.42 |
| සමස්ත මෙහෙයුම් වියදම් | 853,081,058.26 | 758,256,157.40 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය (හිඟය) | 20,987,587.93 | (2,813,907.83) |
| ශිෂ්‍යයන් සඳහා මූල්‍යමය ආධාර | 80,990,000.00 | 71,643,050.00 |
| සමස්ත ක්‍රියාකාරකම්වලින් අතිරික්තය (හිඟය) | (60,002,412.07) | (74,456,957.83) |
| අතිවිශේෂ අයිතමයන් (කපා හැරීම් සහ අනෙකුත් ගැලපුම්) | 287,929.03 | 449,562.03 |
| අදාල කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය (හිඟය) පොදු සංචිතයට මාරු කිරීම් | **(60,290,341.10)** | **(74,906,519.86)** |

නිවැරදි බවට සහතික කළෙමු.

මහාචාර්ය වී අරසරත්නම්, ගිණුම්කරණ නිළධාරී, උප කුලපති.

එස්. සී. රාමක්‍රිෂ්ණන්, මුල්‍යාධිකාරී.

**යාපනය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව**

2011 වසරෙහි දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | 2011 දෙසැම්බර් මස 31 වැනි දිනට රුපියල් | රුපියල් | 2010 දෙසැම්බර් මස 31 වැනි දිනට රුපියල් | රුපියල් |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 938,383,829.10 | | 863,604,312.46 | |
| ආයෝජන (දීගු කාලීන) | 216,531,121.99 | | 201,051,753.62 | |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 59,408.750.00 | **1,214,323,701.09** | 59,408,750.00 | **1,124,064,816.08** |
| **ජංගම වත්කම්** | | | | |
| ඉන්වෙන්ටරි/තොග | 15,416,915.34 | | 16,067,128.97 | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු | 549,096,599.40 | | 376,485,373.50 | |
| ආයෝජන (කෙටි කාලීන) | 7,501,740.33 | | 7,390,773.67 | |
| මුදල් සහ මුදල් සම | 242,583,619.99 | **814,598,875.06** | 189,331,659.94 | **589,274,936.08** |
| සමස්ත වත්කම් | | **2,028,922,576.15** | | **1,713,339,752.16** |
| **වගකීම්** | | | | |
| ජංගම වගකීම් | | | | |
| ගෙවිය යුතු | 31,170,060.87 | | 16,981,385.09 | |
| උපචිත වියදම් | 4,164,384.60 | | 4,763,075.39 | |
| ස්වයං මූල්‍ය පාඨමාලා | 69,955,396.83 | **105,289,842.30** | 66,358,121.54 | **88,102,582.02** |
| ජංගම නොවන වගකීම් | | | | |
| ගෙවිය යුතු | 5,732,115.39 | | 4,979,843.89 | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 191,212,420.99 | | 178,398,183.50 | |
| පරිමිත අරමුදල | 263,852,425.90 | **460,796,962.28** | 235,870,806.90 | **419,248,834.29** |
| සමස්ත වගකීම් | | **566,086,804.58** | | **507,351,416.31** |
| සමස්ත ශුද්ධ වත්කම් | | **1,462,835,771.57** | | **1,205,988,335.85** |
| ශුද්ධ වත්කම්/ව්‍යාපාර වස්තු අගය | | | | |
| එක්රැස් අරමුදල (ප්‍රාග්ධන ප්‍රතිපාදන) | 2,397,860,091.83 | | 2,079,969,079.00 | |
| **සංචිත** | | | | |
| පොදු සංචිත | (1,093,274,836.07) | | (1,028,085,872.97) | |
| බැඳුම්කර සංචිත | 158,192,655.81 | | 154,047,269.82 | |
| ප්‍රාග්ධන සංචිත | 57,860.00 | **1,462,835,771.57** | 57,860.00 | **1,205,988,335.85** |
| සමස්ත ශුද්ධ වත්කම්/අගයන් | | **1,462,835,771.57** | | **1,205,988,335.85** |
| සමස්ත වගකීම් | | **566,086,804.58** | | **507,351,416.31** |
| සමස්ත වගකීම් සහ අගයන් | | **2,028,922,576.15** | | **1,713,339,752.16** |
| සමස්ත අරමුදල් ක්‍රියාකාරීත්වය | | | | |

නිවැරදි බවට සහතික කළෙමු.

මහාචාර්ය වී අරසරත්නම්, ගිණුම්කරණ නිළධාරී, උප කුලපති.

එස්. සී. රාමක්‍රිෂ්ණන්, මුල්‍යාධිකාරී.

උප කුලපති,
යාපනය විශ්ව විද්‍යාලය.

**යාපනය විශ්ව විද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

යාපනය විශ්ව විද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (1) හා 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) හා (7) උප වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාරව යාපනය විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා වෙත 2012 අගෝස්තු මස 15 දින නිකුත් කරන ලදී.

1.2 *මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම*

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම් වේ.

1.3 *විගණකගේ වගකීම*

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම් වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම සඳහා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 *තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම*

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

2.1 *තත්ත්වාගණනය කළ විගණන මතය*

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට යාපනය විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම*

2.2.1 *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත*

(i) පොත් අගය ශුන්‍ය අගයක් වූ එහෙත් අඛණ්ඩව භාවිතයේ පවතින ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක 18 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ ජංගම - නොවන වත්කම් උපලේඛනයෙහි පහත දැක්වෙන විස්තර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 ප්‍රකාරව ඇතුළත් කර නොතිබුණි.

(අ) වර්ෂය ආරම්භයේ හා වර්ෂය අවසානයේ දළ ධාරණ අගය හා සමුච්චිත ක්ෂය

(ආ) කාල පරිච්ඡේදය ආරම්භයේ හා අවසානයේ එකතු කිරීම්, අත්කර ගැනීම්, අපහරණයන්, ක්ෂය කිරීම් හා වෙනත් සංචලනයන් දැක්වෙන පරිදි ධාරණ අගය පිළිබඳ සැසඳීමක්

(iii) රු. 14,105,090 ක් වූ පාරිතෝෂික ගෙවීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව පාරිතෝෂික ප්‍රතිපාදන ගිණුමට හර කරනු වෙනුවට ආදායම් ප්‍රකාශනයට සෘජුවම හර කර තිබුණි.

2.2.2 *ගිණුම්කරණ අඩුපාඩු*

විගණනයේදී පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණ විය.

(අ) මූල්‍ය ප්‍රකාශන වල 2005, 2006, 2007, 2008 හා 2009 වර්ෂ වලට අදාලව දැක්වෙන රු. 2,191,072 ක් වටිනාකම වූ පොත් හා වාර සඟරා සහ රු. 1,359,072 ක් වටිනාකම වූ සඟරා හා වාර සඟරා විෂයයන් 87 ක් සැපයුම්කරුවන්ගෙන් ලැබී නොතිබුණි. කෙසේ වුවද එම පොත් හා වාර සඟරා වෙනුවෙන් රු. 438,214 ක් වූ ක්ෂය ආදායමට එරෙහිව අයකර තිබුණි.

(ආ) රු. 1,708,750 ක් වූ ගොඩනැගිලි වැඩ නිමකර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් භාරදී තිබුණි. කෙසේ වුවද, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වැඩ නිම කිරීමේ සහතිකය ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) රු. 1,093,395,992 ක් වූ ආදායමට වැඩි වියදම් ඉක්මවීම සමුච්චිත අරමුදලට අයකරනු වෙනුවට පොදු සංචිතයට සාවද්‍යව හර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2011 දෙසැම්බර් 31 දිනට පොදු සංචිතයෙහි හර ශේෂයක් දැක්වුණි.

(ඈ) රිදී ජුබිලි අරමුදලින් රු. 243,100 කට මිලදී ගත් ත්‍රිරෝද රථය 2006 වර්ෂයේ සිට ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2010 වර්ෂය තුළදී ඉන්දියානු රජය විසින් විශ්ව විද්‍යාලයට පරිත්‍යාග කරන ලද සිටි රයිඩර් බස් රථ 3 ක් සමාලෝචිත වර්ෂය වන විටත් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) කොළඹ පිහිටි අමුත්තන්ගේ නිවාසයට අදාළව 2008, 2009, 2010 හා 2011 වර්ෂ වලදී විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලයෙන් ලැබිය යුතු කුලී ආදායම පිළිවෙලින් රු. 6,140, රු. 2,428, රු. 35,900 ක් හා 24,700 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(උ) 2011 දෙසැම්බර් මස 31 දිනට අවිනිශ්චිත ගිණුමේ ශේෂය ලෙස රු. 364,569 ක මුදලක් දක්වා තිබුණු අතර, මෙයින් රු. 103,410 ක මුදලක් වර්ෂ 5 කට වැඩි කාලයක් නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව පැවතුණි.

(ඌ) රු. 63,197 ක් වටිනාකම වූ නිවැරදි කිරීම් කිහිපයක් ගබඩා ලේඛනයේ හා ආනයන අත්තිකාරම් ගිණුමේ (නඩත්තු) ජර්නල් සටහන් නොමැතිව සිදුකර තිබුණි.

(එ) 2011 දෙසැම්බර් 31 දිනට පොත් හා වාර සඟරා අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂය එකතුව රු. 24,134,681 ක් වූ අතර ඊට අනුරූපව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කරන ලද ශේෂය රු. 23,364,882 ක් විය. එම ශේෂ සසඳා නොතිබූ අතර රු. 769,799 ක් වූ වෙනසට හේතු විගණනයට පැහැදිළි කර නොතිබුණි.

2.2.3 *ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :-

(අ) හිඟ ශේෂයන්හි වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ රු. 504,237 ක ලැබිය යුතු වෙළඳ ශේෂ ඇතුළත්ව තිබුණු අතර, ගිණුම්වල අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ආ) වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ රු. 2,562,402 ක ගෙවිය යුතු වෙළඳ ශේෂ පරිශේෂයන් තුළ ඇතුළත්ව තිබුණි.

(ඇ) රු. 1,353,830 ක් වූ විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලයට නොගෙවන ලද වැටුප්, මුදල් රෙගුලාසි 272(2) හා 290 ට අනුකූලව කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 1 සිට 5 දක්වා කාලයක් ගෙවිය යුතු ශේෂ ලෙස පැවතුණි.

(ඈ) අධ්‍යයන කාර්ය මණ්ඩලයට 1997 වර්ෂයේදී පොත් දීමනා මත වැඩිපුර ගෙවන ලද රු. 37,455, ක් 2011 වර්ෂය දක්වා අයකර ගෙන නොතිබුණි.

(ඉ) ගොඩනැගිලි, පුනරුත්ථාපන හා හදිසි කටයුතු දෙපාර්තමේන්තුව, ලංකා විදුලි බල මණ්ඩලය හා මොරටුව විශ්ව විද්‍යාලය, වැනි විවිධ පාර්ශ්වයන්ට සැපයුම්, ආනයනයන්, පොත් හා වාර සඟරා, සේවක වැටුප්, විවිධ අත්තිකාරම් සඳහා ගෙවන ලද එකතුව රු. 298,536,398 ක් වූ අත්තිකාරම් අයකර ගෙන නොතිබුණි. මෙම ශේෂයන් රු. 6,362,536 ක් වර්ෂ 10 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඊ) නිලධාරියෙකුගෙන් ලැබිය යුතු රු. 53,055 ක් වූ ආපදා ණය ශේෂය, වෙනත් නිලධාරියෙකුගෙන් ලැබිය යුතු රු. 10,802 ක් වූ යතුරු පැදි ණය ශේෂය සහ තවත් නිලධාරියෙකුගෙන් ලැබිය යුතු රු. 18,000 ක් වූ පරිගණක ණය වර්ෂ 8 සිට 10 දක්වා කාලයක් හිඟ හිට පැවතුණි.

(උ) පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, උපකරණ හා පොත් හා වාර සඟරා ආනයනය සඳහා 2011 වර්ෂයේ ගෙවන ලද මුළු අත්තිකාරම් වලින් 93% ක අත්තිකාරම් විධිමත් ඇගයීමකින් තොරව 2011 මුදල් වර්ෂයේ අවසාන දින ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ නිශ්චිත කාර්යයන් සඳහා ගෙවන ලද අරමුදල් ඇණවුම් කරන ලද විෂයයන් සැපයීමේ විශාල ප්‍රමාදය හේතුවෙන් වර්ෂය මුළුල්ලේ නිෂ්කාර්යව පැවතීමට ඉඩ හැර තිබුණි.

(ඌ) පරිභෝජ්‍ය ද්‍රව්‍ය සැපයුම් අත්තිකාරම් ලේඛනයට අනුව රු. 187,534 ක මුදලක් සම්පූර්ණයෙන් නිරවුල් කළ ලෙස දක්වා තිබුණි. එහෙත් මූල්‍ය ප්‍රකාශන වලට අනුව නිරවුල් නොකළ සැපයුම් අත්තිකාරම් රු. 810,480 ක් විය, තව ද, නිරවුල් කිරීම් පිළිබඳ විස්තර විගණනයට ලැබී නොතිබුණි.

2.2.4 *විගණනය සඳහා සාක්ෂි නොවීම*

පහත නිරක්ෂණයෙන් කරනු ලැබේ.

(අ) වාර්ෂික සමීක්ෂණ වාර්තා, තොග සමීක්ෂණ වාර්තා, සනාථ කිරීම්, කාල විශ්ලේෂණ විස්තරාත්මක උපලේඛන, වාහන ලොග් පොත්, ඇතැම් වාහන සඳහා දෛනික ධාවන වාර්තා, තක්සේරු වාර්තා හා දුරකතන ලේඛනය ආදී සාක්ෂි නොමැතිවීම හේතුවෙන් වත්කම්, ඉන්වෙන්ට්‍රි විෂයයන්, ගෙවිය යුතු ශේෂ, ලැබිය යුතු ශේෂ, ඉන්ධන හා තෙල් වියදම්, වාහන හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා හා නඩත්තු වියදම්, කෙරී ගෙන යන වැඩ, කුලී ගෙවීම් හා විදුලි සංදේශ ගාස්තු එකතුව රු. 1,323,032,618 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ආ) පහත දැක්වෙන සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පරිත්‍යාග විෂයයන්, කුලී ආදායම්, තොග, පාඩු හා කාර්ය මණ්ඩල ණය ආදී ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කළ නොහැකි විය.

- විවිධ විදේශ රට වලින්/තානාපති කාර්යාල වලින් ලැබුණු පරිත්‍යාග පිළිබඳ විස්තරාත්මක වාර්තා, කුලියට දී ඇති පරිශ්‍ර පිළිබඳ තක්සේරු වාර්තා සහ කුලී ආදායම් ලේඛනය
- විශ්ව විද්‍යාලයේ පාලක සභා රැස්වීම් වල සටහන්
- මුදල් කමිටුවේ රැස්වීම් සටහන්
- පුස්තකාල කමිටුවේ රැස්වීම් සටහන්
- යාපනය විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව
- වාර්ෂික සමීක්ෂණ වාර්තා
- අනතුරු/නැතිවීම පිළිබඳ වාර්තා - උදාහරණ පොත් නැතිවීම
- ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂවල කාල විශ්ලේෂණ උදාහරණ - සේවක ණය

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවීම අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 155 වගන්තිය

(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය
v පරිච්ඡේදයේ 7.8 වගන්තිය
xix පරිච්ඡේදයේ 5.8 වගන්තිය
xx පරිච්ඡේදයේ 3.1 වගන්තිය
xxiv පරිච්ඡේදයේ 3.1 වගන්තිය
xxv පරිච්ඡේදයේ 2.2 (ඊ) වගන්තිය
xxvi පරිච්ඡේදයේ 2, 4, 3. 3, 04 හා 05 වගන්ති
xxvii පරිච්ඡේදයේ 9.4 වගන්තිය

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය - xxv පරිච්ඡේදයේ 3.8 වගන්තිය

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 102 (ආ), 103 (1), 104, 106, 107, 109, 110, 134(2), 135, 138, 264, 271(2), 272(3), 290, 396, 452, 569, 756,772, 845(1), 850, 1645, සහ 1646

(ඊ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ
(i) 1980 පෙබරවාරි 25 දිනැති අංක 63
(ii) 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94
(iii) 1995 ජූලි 14 දිනැති අංක 636
(iv) 1995 ඔක්තෝබර් 05 දිනැති අංක 649
(v) 2010 පෙබරවාරි 15 දිනැති අංක 02/2010

(උ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
(i) 1990 ඔක්තෝබර් 10 දිනැති 41/90
(ii) 1989 මාර්තු 23 දිනැති අංක 19/89

(ඌ) භාණ්ඩාගාර චක්‍රලේඛ
(i) 1989 ජූනි 16 දිනැති අංක 52
(ii) 1979 ජූලි 29 දිනැති අංක 828

(එ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 *මූල්‍ය ප්‍රතිඵල*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමට පෙර රු. 833,942,534 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 611,306,520 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු. 773,652,193 ක රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 60,290,341 දක්වා අඩුවී තිබුණු අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු. 536,400,00 ක රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසු එම වර්ෂයේ ඌනතාවය රු. 74,906,520 දක්වා අඩුවී තිබුණි. ඒ අනුව විශ්ව විද්‍යාලයේ මෙහෙයුම් වලින් වූ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 222,636,014 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි.

3.1.2 *ආර්ථික නොවූ ගණුදෙනු*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :-

(අ) කාර්යාල දුරකතන ගාස්තු අඩුකිරීමේ අරමුණින් දැනට පවත්නා සෘජු දුරකතන භාවිතය අඩුකිරීම මගින් 2011 ජනවාරි මාසයේදී විශ්ව විද්‍යාලයේ දුරකතන ඉන්ටර්කොම් පහසුකම් ස්ථාපිත කර තිබුණි. කෙසේ වුවද 2010 වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා දුරකතන ගාස්තු රු. 2,496,589 කින් එනම් 25% කින් විශාල ලෙස වැඩිවී තිබුණි.

(ආ) විශ්ව විද්‍යාලයේ බස් රථ තුනක් සහිතව මෝටර් වාහන 16 ක් එහි වාහන සංචිතයට ඇතුළත්ව තිබුණද, ඇස්තමේන්තුගත වාහන කුලී ගාස්තු 75% කින් ඉක්මවමින් රු. 2,506,648 ක මුදලක් ඒ සඳහා ගෙවා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ ඉන්ධන හා තෙල් වියදම් සඳහා 51% කින් ඇස්තමේන්තු ගත මුදල ඉක්මවා තිබුණි.

(ඈ) 2009 අප්‍රේල් මස සිට විශ්ව විද්‍යාලයේ අමුත්තන්ගේ නිවාසය විශ්ව විද්‍යාල ලේඛකාධිකාරිවරයා හෝ නියෝජ්‍ය ලේඛකාධිකාරිවරයා විසින් කිසිදු කුලී ගෙවීමකින් තොරව භාවිතා කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දී මේ සම්බන්ධයෙන් වූ විදුලි ගාස්තු එකතුව රු. 26,253 ක් විශ්ව විද්‍යාලය අරමුදල් වලින් ගෙවා තිබුණි.

(ඈ) අමුත්තන්ගේ නිවාසයේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පියවර ගන්නා බව විගණන විමසුමට පිළිතුරු වශයෙන් දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළදී පෞද්ගලික හෝටල් සඳහා නැවතීම් ගාස්තු ලෙස රු. 379,113 ක මුදලක් ගෙවා තිබුණි.

3.1.3 *දේපළ පිරියත හා උපකරණ (PPE)*

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 1,933,590,051 ක් වූ දේපළ පිරියත හා උපකරණ වටිනාකම පොත් අගය මත දක්වා තිබුණි. කෙසේ වුවද මෙම වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණ සමාලෝචිත වර්ෂය තුළ සිදුකර නොතිබුණි.

3.1.4 *මූල්‍ය කළමනාකරණය*

(අ) *මුදල් කළමනාකරණය*

2011 දෙසැම්බර් 31 දිනට යාපනය විශ්ව විද්‍යාලයේ මහජන බැංකු ශාඛාවේ බැංකු ශේෂයක් ලෙස රු. 225,919,873 ක මුදලක් දක්වා තිබුණද එම මුදල අරමුණු කල කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට හෝ පූර්ව අනුමැතිය සහිතව එම මුදල ආයෝජනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) *ආයෝජන*

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල රු. 216,531,122 ක් හා රු. 7,501,741 ක මුදලක් පිළිවෙලින් දිගු කාලීන හා කෙටි කාලීන ආයෝජන ලෙස දක්වා තිබුණු අතර, ආයෝජන වලින් ආදායම රු. 113,040 ක් එනම් මුළු ආයෝජන වලින් 0.05% ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව උපරිම ආදායම් ඉපයීම සඳහා විශ්ව විද්‍යාල අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර නොතිබුණි.

3.1.5 *වත්කම් කළමනාකරණය*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ :-

( i) පහත දැක්වෙන වාහන නිෂ්කාර්ෂව පැවතුණු අතර එම වාහන විශ්ව විද්‍යාලයේ අරමුණුගත කාර්යයන් සඳහා යොදා ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේම මෙම කාරණය මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තා වලින්ද පෙන්වා දී ඇත.

| | |
|---|---|
| ලෑන්ඩ් | 01 |
| මාස්ටර් | |
| ස්කූටර් | 500 |
| යතුරු පැදි | 02 |
| ත්‍රීරෝද රථ | 01 |
| | 05 |

(ii) එකතුව රු. 3,953,319 ක් වූ සැපයුම් හා නඩත්තු විෂයයන් වර්ෂ 01 සිට 13 දක්වා කාලයක් භාවිතා නොකර විශ්ව විද්‍යාලයේ ගබඩාවල පැවතුණි. ඒවා උපයෝජනය කිරීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(iii) රු. 182,4000 ක් වූ වේලා සටහන් යන්ත්‍රයක් 2001 වර්ෂයේ සිට භාවිතා නොකර පැවතුණි.

(iv) රු. 1,482,000 කට මිලදී ගත් යකඩ ඇඳන් 156 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් භාවිතා නොකර පැවතුණි.

(v) කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ පීඨාධිපති කාර්යාලයේ, මානව සම්පත් දෙපාර්තමේන්තුවේ, ගිණුම්කරණ දෙපාර්තමේන්තුවේ හා භෞතික විද්‍යා දෙපාර්තමේන්තුවේ පරිඝණක හා උපාංග, මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් උපකරණ හා ලීබඩු 161 ක සංඛ්‍යාවක් නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම් ලෙස හඳුනා ගෙන තිබුණි.

3.1.6 *මතභේදයට තුඩුදෙන විෂයයන් :*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගොඩනැගිලි, සම්පත් දායකයන්, වෙනත් සියළුම පහසුකම් විශ්ව විද්‍යාලය තුළ තිබුණ ද නීති පීඨයේ දේශන කොළඹ පිහිටි කුලියට ගත් ගොඩනැගිල්ලක පවත්වා තිබුණු අතර ඒ සඳහා මාසයකට රු. 100,000 ක මුදලක් කුලී ලෙස ගෙවා තිබුණි.

(ii) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පැමිණීමේ ලේඛන දීර්ඝ කාලයක සිට පවත්වා නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩල නිවාඩු හා වැටුප් ගෙවීම පිළිබඳ නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය.

(iii) රු. 714,560 ක පිරිවැයකට 2011 මාර්තු හා මැයි මාසවලදී මිලදී ගත් ඇඟිලි සළකුණු ස්කෑනර් යන්ත්‍ර 11 ක් සවි කිරීමට අපේක්ෂා කර තිබුණද, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2010 පෙබරවාරි 15 දිනැති අංක 02/2010 දරන ආයතන චක්‍රලේඛය ප්‍රකාරව අදහස් කළ කාරණයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

3.1.7 *හඳුනාගත් පාඩු :*

විගණනයේදී පොත් 23,493 ක් නැතිවීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වී තිබුණු අතර පැවතුණු කලබලකාරී තත්ත්වය හේතුවෙන් නැතිවීම් සිදු වී ඇති බව විගණනයට පැහැදිලි කර තිබුණි. කෙසේ වුවද පසුගිය වර්ෂ 15 කට වැඩි කාලයක් මුදල් රෙගුලාසි 101 ප්‍රකාරව මෙම නැතිවීම් සම්බන්ධයෙන් වාර්තා කිරීමට පියවර ගෙන නොතිබුණි.

3.1.8 *කොන්ත්‍රාත් පරිපාලනය :*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රාමනාදන් ලලිත කලා පීඨය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම

රාමනාදන් ලලිත කලා පීඨය සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය 1999 වර්ෂයේදී ආරම්භ කරන ලදී. රාමනාදන් ලලිත කලා පීඨයේ අදියර 111 "ඒ" මට්ටම පින්තාරු කිරීම හා මූර්ති ශිල්ප මැදිරි ඉදිකිරීම් වැඩ 2011 අගෝස්තු වන විට නිම කිරීමට නියමිත විය. කෙසේ වුවද ඉහත වැඩවලින් 40% ක් පමණක් 2011 දෙසැම්බර් 31 දක්වා නිම කර තිබුණු අතර, රු. මිලියන 94.4 ක මුදලක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට 2011 දෙසැම්බර් 31 දක්වා මුදා හැර තිබුණි. ඒ - මට්ටමේ වැඩ 2012 පෙබරවාරි 21 දින යාපනය විශ්ව විද්‍යාලයට භාරදී තිබුණද, වැඩ නිම කිරීමේ සහතිකය ඉදිරිපත් කර නොතිබුණි. බී- මට්ටමේ හා සී - මට්ටමේ වැඩ 2012 ඔක්තෝබර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ii) නේවාසිකාගාර සංකීර්ණයට ජල සැපයුම් වැඩි දියුණු කිරීම - ගැළුම් 25,000 ක ඉහල ජල ටැංකියේ ඉතිරි වැඩ

ඉහත ව්‍යාපෘතියේ වැඩ රු. මිලියන 2.3ක මුළු ඇස්තමේන්තු පිරිවැයකට 1989 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් 1990 ජුනි මාසයේදී නවතා තිබුණි. ඉතිරි වැඩ සඳහා සංශෝධිත ඇස්තමේන්තුව 2009 වර්ෂයේදී විශ්ව විද්‍යාලය විසින් භාරගෙන තිබුණි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ උතුරු පළාත් ප්‍රධාන ඉංජිනේරු විසින් 2011 අගෝස්තු 24 දිනැති ලිපිය මගින් සංශෝධිත ඇස්තමේන්තුව ප්‍රකාරව රු. මිලියන 18 කට ඉතිරි වැඩ නිම කල හැකි බව සනාථ කර තිබුණද 2012 ඔක්තෝබර් 31 දින වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි.

(iii) උපාධි අධ්‍යාපන පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම 2011 වර්ෂයේ නිම කිරීමට අපේක්ෂා කර 2011 වර්ෂයේදී රු. මිලියන 12.1 ක මුදලක් ගෙවා තිබුණද භෞතික ප්‍රගතිය 8% ක් පමණක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 28% ක් විය. ඉහත ව්‍යාපෘති කාර්යයන් නිම කිරීමේ අනවශ්‍ය ප්‍රමාදය හේතුවෙන් ඉදිකිරීම් පිරිවැය විශාල ලෙස වැඩි වූ අතර එම ඉදිකිරීම් කාර්යයේ අරමුණ විශ්ව විද්‍යාලයට ළඟා කර ගත නොහැකි විය.

3.1.9 *බලය නොලත් ගනුදෙනු:*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විශ්ව විද්‍යාලයේ නිල වාහන විශ්ව විද්‍යාලයේ නිලධාරීන්ට තම නිවස/අමුත්තන්ගේ නිවාසය හා විශ්ව විද්‍යාලය අතර ගමන් සඳහා පූර්ව අනුමැතියකින් තොරව භාවිතා කිරීමට ඉඩ හැර තිබුණි.

(ii) 2004 සිට 2006 දක්වා වර්ෂවල විද්‍යා, භූගෝල විද්‍යා හා රසායනාගාර ශාලා සඳහා කරන ලද ආපසු ගෙවිය යුතු තැන්පතු එකතුව රු. 501,975 ක් උපකුලපතිවරයාගේ අනුමැතිය සහිතව 2011 ජූලි 29 වැනි දින පෙර වර්ෂ (ලැබීම්) ගිණුමට මාරු කර තිබුණි. තැන්පතුකරුවන්ගේ (ශිෂ්‍යයින්ගේ) කැමැත්ත ලබා ගැනීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණු අතර මේ දක්වා මෙම මාරු කිරීම් සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කර නොතිබුණි. ආපසු ගෙවිය යුතු තැන්පතු පෙර වර්ෂ ගිණුමට මාරු කිරීමට විශ්ව විද්‍යාල පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ශිෂ්‍යයින් විශ්ව විද්‍යාලයෙන් පිටව යන අවස්ථාවේදී ඔවුන්ට තැන්පතු ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

3.1.10 *අවිධිමත් ගෙවීම් :*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශක ඒකකයේ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලද වැඩ සැලැස්ම හා පිරිවැය ඇස්තමේන්තුව අනුව යාපනය විශ්ව විද්‍යාලය සඳහා ප්‍රධාන සැලැස්ම පිළියෙල කිරීමේ උපදේශක සේවාව සඳහා යාපනය විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් රු. 2,450,000 (වැට් නොමැතිව) ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව 2011 සැප්තැම්බර් 24 දින අනුමත කර තිබුණි. විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අනුමැතිය සහිතව 2011 දෙසැම්බර් 23 දින හා 2012 ජූලි 05 දින පිළිවෙලින් රු. 490,000 ක් හා රු. 260,000 ක් වූ මුදල් වැඩ පූර්ව අත්තිකාරම් ලෙස මුදා හැර තිබුණි. කෙසේ වුවද ආදල පාර්ශ්වයන් විසින් අවබෝධතා ගිවිසුමක් (Mou) අත්සන් කර නොතිබුණු අතර 2012 ඔක්තෝබර් 31 දක්වා අදාල කාර්ය නිම කර නොතිබුණි.

(ii) උපාධි අධ්‍යයන පීඨය සඳහා ගොනැගිල්ලක් ඉදි කිරීමට රු. 36,011,600 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් විශ්ව විද්‍යාල පාලක සභාව විසින් අනුමත කර තිබුණි. යාපනය විශ්ව විද්‍යාලය, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) සමග 2012 අප්‍රේල් 24 දින මේ සඳහා ගිවිසුමක් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉංජිනේරුවරයා විසින් ඊ- මේල් ලියවිල්ලක් මගින් කරන ලද ඉල්ලීමට අනුව ගිවිසුමක් නොමැතිව වැඩ පූර්ව අත්තිකාරම් ලෙස රු. 8,066,603 ක මුදලක් එනම් මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් 20% ක් (වැට් ඇතුලත්ව) 2011 සැප්තැම්බර් 22 දින ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවා තිබුණි.

(ආ) උපදේශක සේවාව සඳහා මෙන්ම වැඩ සඳහා කොන්ත්‍රාත්කරු ලෙසද ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය පත්කර තිබුණි. මේ සම්බන්ධයෙන් උපදේශක සේවයෙහි මෙන්ම කොන්ත්‍රාත් කාර්යෙහිද එකම පාර්ශ්වයක් මැදිහත්වීම හේතුවෙන් ඇතිවිය හැකි ගැටීම සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(ඇ) 2011 ඔක්තෝබර් 31 දක්වා වැඩ සැලැස්මට අනුව වැඩ නිමකර නොතිබුණි.

**3.2 මෙහෙයුම් සමාලෝචනය**

3.2.1 *විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම :*

විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨ යටතේ පවත්වන ලද පාඨ මාලා සඳහා විභාග පැවැත්වීමේ දිනයන් හා එම විභාග සඳහා වූ ප්‍රතිඵල නිකුත් කිරීමේ ඉලක්ක දිනයන් තීරණය කර නොතිබුණි. 2010 හා 2011 වර්ෂ තුළ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම, කලා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ සහ විද්‍යා පීඨවල හා බාහිර විභාග ඒකකය විසින් පවත්වන ලද විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමේදී විශාල ප්‍රමාදයන් තිබූ බව නිරීක්ෂණය විය. 1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව විභාග පැවැත්වීමෙන් පසු මාස තුනක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කල යුතුය. එහෙත් ප්‍රතිඵල මාස 4 සිට මාස 14 ක කාලයක් ප්‍රමාද කර තිබීම හේතුවෙන් ශිෂ්‍යයින්ගේ රැකියා අවස්ථාවන් කාලීනව ලබා ගැනීම ඔවුන්ට අහිමි කර තිබුණි.

3.2.2 *ඒක ශිෂ්‍ය පිරිවැය :*

විශ්ව විද්‍යාලයේ පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 5,425 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු පුනරාවර්තන වියදම් රු. 555,663,167 ක් විය. ඒ අනුව වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු. 102,426 ක් විය.

3.2.3 මානව සම්පත් කළමනාකරණය :

කාර්ය මණ්ඩලයේ පවත්නා පුරප්පාඩු සඳහා සුදුසු පුද්ගලයින් බඳවා ගැනීමට විශ්ව විද්‍යාලය කටයුතු කර නොතිබුණු අතර ඒ වෙනුවට තාවකාලික පදනම මත වැඩිපුර කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණි. විස්තර පහත පරිදි වේ.

| *වර්ගය* | *අනුමත සේවක සංඛ්‍යාව* | *තථ්‍ය සේවක සංඛ්‍යාව* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *අතිරේඛ සේවක සංඛ්‍යාව* |
|---|---|---|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 456 | 338 | 118 | - |
| අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | 56 | 30 | 26 | - |
| තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය | 126 | 168 | 04 | 46 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 726 | 531 | 195 | - |
| එකතුව | 1,364 | 1,067 | 343 | 46 |

අවස්ථා කිහිපයක දී පුරප්පාඩු පිරවීමට බඳවා ගැනීම් සිදු කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණ ද 2012 ඔක්තෝබර් 31 වන විටත් බඳවා ගැනීම් සිදු කර නොතිබුණි. බඳවා ගැනීම් ප්‍රමාදය සඳහා හේතු විශ්ව විද්‍යාලය විසින් ඉදිරිපත් කර නොතිබුණි.

3.2.4 *බඳවා ගැනීම් සහ පත්කිරීම් :*

"BBM" (On Line) උපාධි වැඩ සටහන පැවැත්වීම සඳහා විශ්වවිද්‍යාල පාලක සභා අනුමැතිය මත අධ්‍යයන මණ්ඩලය විසින් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය ඒ සඳහා යෝජනා කර තිබුණි. මේ සම්බන්ධයෙන් දේශකවරුන් පත්කර විෂය කරුණු විශේෂඥ හා විෂය කරුණු සමාලෝචකයන් සඳහා ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැඩ සටහනේ 1, 2 හා 3 වර්ෂවල විෂය කරුණු සඳහා විෂය කරුණු විශේෂඥයන් සහ විෂය කරුණු සමාලෝචකයන් පත් කිරීම සඳහා විධිමත් බඳවා ගැනීම් යෝජනා ක්‍රමයක්, බඳවා ගැනීම් ක්‍රමයක්, තෝරා ගැනීමේ නිර්නායකයන්, තෝරා ගැනීම් සහ පත් කිරීම් සඳහා පදනම, ගෙවීම් ක්‍රමය සඳහා තීරණයන් අනුගමනය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් විෂය කරුණු විශේෂඥයන් සඳහා රු. 1,100,000 ක මුදලක් හා විෂය කරුණු සමාලෝචකයන් සඳහා රු. 410,000 ක් ගෙවා තිබුණි. පහත දැක්වෙන කරුණු හේතුවෙන් මෙම ගෙවීම් අවිධිමත් ගෙවීම් ලෙස සැලකිය හැක.

(i) කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් එක් දේශකයෙකු එක් විෂයයකට වැඩියෙන් විෂය කරුණු විශේෂඥ හා විෂය කරුණු සමාලෝචක ලෙස පත්කර තිබුණි.

(ii) ආර්ථික විද්‍යා මූලධර්ම විෂය (BBM 1201) සඳහා එක් දේශකවරයෙකු විෂය කරුණු විශේෂඥ හා විෂය කරුණු සමාලෝචක යන දෙකටම පත්කර තිබුණු අතර විෂය කරුණු සමාලෝචනය සඳහා රු. 20,000 ක් ද ගෙවා තිබුණි.

(iii) විශ්ව විද්‍යාලයේ, ආර්ථික විද්‍යා, නීති හා පරිඝණක විද්‍යා දෙපාර්තමේන්තුවලින් අදාළ ක්ෂේත්‍රයේ දේශකවරු හා වෘත්තිකයින් ලබාගත හැකි වුව ද, ආර්ථික විද්‍යා, නීති හා පරිඝණක විෂය කරුණු විශේෂඥවරුන් හා විෂය කරුණු සමාලෝචකයන් ලෙස කළමනාකරණ අධ්‍යයන හා වානිජ පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට පත් කර තිබුණි.

3.2.5 *භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම :*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය හා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර විගණනයකට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) කුලියට ලබාගෙන ඇති දේපළ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් වාර්තාවක් ලබාගැනීමෙන් තොරව මාසිකව කුලිය ලෙස රු. 95,000 ක මුදලක් ගෙවීමට එකඟ වී තිබුණි.

3.2.6 *ඒකාබද්ධ සමාජ වගකීම (CSR) ළඟා කර නොගැනීම :*

*විශ්ව විද්‍යාලයේ කාන්තා නේවාසිකාගාර සංකීර්ණය සඳහා අප ජලය අපහරණ පද්ධතිය*

විශ්ව විද්‍යාලයේ කාන්තා නේවාසිකාගාර සංකීර්ණයේ අප ජලය අපහරණ පද්ධතිය සඳහා 2008 වර්ෂය තුළ දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට රු. 750,375 ක් වූ උපදේශක සේවා ගාස්තු අත්තිකාරමක් ලෙස ගෙවා තිබුණි.

යාපනය විශ්ව විද්‍යාලය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර 2008 ජූනි 19 දින රු. 9,004,500 ක් වූ (වැට් නොමැතිව) මුළු පිරිවැය ඇස්තමේන්තුවකට අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. පසුව එම ඇස්තමේන්තුව රු. 18,881,695 කට එනම් 109.7% කින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සංශෝධනය කර තිබුණි.

උපකුලපතිවරයාගේ 2010 නොවැම්බර් 08 දිනැති අංක ඒ/සීඩබ්පී/01 දරන ලිපියට අනුව එම සංශෝධිත ඇස්තමේන්තුව විශ්ව විද්‍යාල පාලක සභාව විසින් මෙතෙක් අනුමත කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ ප්‍රමාදය හේතුවෙන් පසුගිය වර්ෂ 3ක කාලයක් විශ්ව විද්‍යාලය අවට ජීවත් වන ජනයාට අපවිත්‍ර ජලය මගින් බලපෑම් සිදු වී තිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය**

4.1 *සංයුක්ත සැලැස්ම :*

2011 සිට 2015 දක්වා කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්ම 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර වාර්ෂිකව යාවත්කාලීන කර තිබුණි.

4.2 *වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම :*

ක්‍රියාකාරී සැලැස්ම 2011 වර්ෂය සඳහා පිළියෙල කරනු වෙනුවට 2011 සිට 2015 දක්වා කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබුණි. කෙසේ වුව ද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණු ඉලක්ක පිළිබඳ ප්‍රගතිය කාලීනව සමාලෝචනය කර නොතිබුණි.

4.3 *අභ්‍යන්තර විගණනය :*

විශ්ව විද්‍යාලය විසින් පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන වැඩ සටහනෙන් පහත දැක්වෙන ක්ෂේත්‍රයන් ආවරණය වී නොතිබුණි.

(අ) විශ්ව විද්‍යාලයේ වවුනියා මණ්ඩපය

(ආ) ප්‍රාග්ධන වැඩ ව්‍යාපෘති හා කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) ප්‍රසම්පාදන

(ඈ) ණය සහ අත්තිකාරම්

4.4 *විගණන විමසුම් පිළිබඳ පසු විපරම් කටයුතු :*

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 හා 2011 වර්ෂ සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 67 කට පිළිතුරු මාස 01 සිට මාස 11 දක්වා වූ විශාල කාල ප්‍රමාදයකින් පසු ඉදිරිපත් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 452 ප්‍රකාරව විගණන විමසුම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(iii) පිළිතුරු නොසපයන ලද විගණන විමසුම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| *වර්ෂය* | *විගණන විමසුම් සංඛ්‍යාව* |
|---|---|
| 2011 | 26 |
| 2010 | 07 |
| | 33 |

4.5 *තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීම :*

සමාලෝචිත වර්ෂය තුළ දී වවුනියා මණ්ඩපය විසින් පවත්වන ලද ඉංග්‍රීසි, පරිඝණක ආදී ව්‍යාප්ත පාඨමාලා සඳහා වෙනම ආදායම් හා වියදම් ගිණුමක් පවත්වා නොතිබුණි.

4.6 *වාර්ෂික වාර්තාව ප්‍රසිද්ධ කිරීම :*

2003 ජූනි 02 දිනැති අංක පී.ඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2008 සිට 2010 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2012 ජූනි 30 දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

4.7 *අයවැය ලේඛනමය පාලනය :*

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**05. පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතු ය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) පුස්තකාල පරිපාලනය

(ඇ) ගබඩා පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) ව්‍යාපෘති ප්‍රමාදය

(ඊ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

(උ) ප්‍රසම්පාදන

(ඌ) මානව සම්පත් කළමනාකරණය

(එ) අයවැය

එච්. ඒ. එස්. සමරවීර,
විගණකාධිපති.

**2011.12.31 න් අවසන් වූ වර්ෂයට අදාළ යාපනය විශ්ව විද්‍යාලයේ ගිණුම් කටයුතු පිළිබඳව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් යාපනය විශ්ව විද්‍යාලය නිකුත් කරනු ලබන නිරීක්ෂණ**

2.2.1

(i) 2013 වර්ෂය තුළ දී නැවත ඇගයීම සඳහා පියවර ගැනීම ;

(ii) (aසහb) දත්ත සියල්ල ක්‍රියාකාරී ගොනුවෙහි ඇතුලත් වේ. කෙසේ නමුත් ඉදිරියේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 ට අනුකූලව වීම සඳහා පියවර ගනු ඇත.

(iii) ඉදිරියේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 විධිවිධාන හා අනුකූල වීම පිණිස පියවර ගනු ඇත. වාර්ෂික ප්‍රතිපාදන ලබා දෙනු ඇති අතර SLAS 16 ට අනුකූලව සත්‍ය පරිතෝෂික ගෙවීම් එම ප්‍රතිපාදන වලින් අඩු කරනු ඇත.

2.2.2

a. සඟරා සහ වාර සංග්‍රහ සැපයීම සඳහා අත්තිකාරම් වශයෙන් ගෙවන මුදල රු. 5,40,887 කි. තොරතුරු හුවමාරු කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර සපයා නොමැති සඟරා සහ වාර සංග්‍රහ සඳහා වන මුදල් ඉදිරියට ගෙන යාමට පියවර ගෙන තිබේ. සැපයුම පූර්ණ වශයෙන් ලැබෙන විට මෙම අත්තිකාරම නිරවුල් වනු ඇති අතර සඟරා සහ වාර සංග්‍රහ ප්‍රාග්ධනීකරණය වනු ඇත.

b. කොන්ත්‍රාත්කරුවන් සඳහා ලබාදිය යුතු අවසන් බිල් පත් පිළිබඳ කටයුතු නිරවුල් කර නොමැති නිසා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් සමහර ව්‍යාපෘති සඳහා වන වැඩ අවසන් කිරීමේ සහතික මේ වන තුරුත් ලබා දී නොමැත.

ගොඩනැගිලි දෙපාර්තමේන්තු පිළිබඳ වැඩ සංකීර්ණ වාර්තාව තවමත් ඉදිරිපත් කර නොමැති නිසා ඇතැම් ව්‍යාපෘති වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට අවසන් බිල්වලට ගෙවීම් සිදුකර නොමැත.

c. සාමාන්‍යයෙන් අතිරික්ත වියදම් පොදු සංචිත ගිණුමට (General Reserve Accounts) බැර කෙරේ.

d සහ e මේ වන විටත් 2012 වර්ෂයේ ගිණුමට බැර කර ඇත.

f. 2012 ගිණුමට බැර කිරීමට කටයුතු කරමින් පවතී.

g. මෙම මිල ගණන් කොළඹ සිට යාපනයට නැව් මගින් භාණ්ඩ ප්‍රවාහණයේ දී සිදුවූ ද්‍රව්‍යමය හානියට අදාළ වන අතර 2013 වර්ෂයේ දී එය නිරාකරණය කර ගැනීමට අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගනු ඇත.

h. 2012 වර්ෂය තුළ රු. 1,750 ක වටිනාකමක් ජර්නල් සටහන්වල ඇතුළත් කර තිබේ. 2012 වර්ෂයේ දී ඇණවුම් පොත නිවැරදි කර ඇති අතර ඊට අදාළ වටිනාකම රු. 61,447 ක් විය.

i වටිනාකමෙහි වෙනස නියමාකාරයට විශ්ලේෂණය කළ විට එයට හේතුව ලෙස සොයාගත හැකි වූයේ, උප ලෙජරයේ ගිණුම් වල එකතුව හා ශේෂ පිරික්සුමෙහි වෙනසකි. ප්‍රධාන ලෙජරයේ වැරදි සටහන් මෙයට හේතුව ලෙස නිර්ණය කර ඇති අතර එය මේ වන විට නිවැරදි කර ඇත.

2.2.3

a සහ b අප විසින් අදාළ පාර්ශ්වයන් හඳුනාගෙන ඇති අතර මෙම ලැබීම් සහ ගෙවීම් පැහැදිලි කර ගැනීම සඳහා ඔවුන් සමග සාකච්ඡා කරනු ලැබේ. ලැයිස්තුව අමුණා ඇත. (ඇමුණුම 1)

c. විවිධාකාර නොගෙවූ වේතන මෙහි දක්වා ඇත. ආදායම් සඳහා නැවත රජයේ ආදායමට බැර කිරීමට ඇතුලු ගැලපුම සඳහා වන වේතනය මත සත්‍ය වශයෙන්ම ගෙවිය නොහැකි ඒවා නැවත හඳුනා ගැනීමට විශ්ලේෂණයක් සිදු කර ඇත. සැබෑවට ගෙවීමට හැකි වේතන හඳුනාගෙන ඒවා ගෙවිය යුතුද නැත්නම් මුළු ආදායමට යළි එකතු කළ යුතු ද යන අවසාන තීරණ වලට එළඹීමේදී අදාළ පාර්ශ්වයන් සම්බන්ධ කර ගනු ලැබේ.

d. ආදායමට මාරු කර ගැනීමට අදාළ "අධිකාරිවල අවධානය" ඇතිව ක්‍රියාමාර්ග ගෙන ඇත.

e. පහත සඳහන් ව්‍යාපෘති දැනට කෙරී ගෙන යන අතර පහත පරිදි ඒවා වර්ග කර දක්වා ඇත.

වත්මත් ව්‍යාපෘති වත්මන් වර්ෂය යටතේ දක්වා ඇත. පසුගිය ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන පසුගිය මූල්‍යාධාර වලින් සැපයේ. සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති සඳහා අදාළ සම්පූර්ණ කළ බවට වූ සහතික ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට සියලු කටයුතු යොදා ඇත.

f. නිලධාරීන්ගේ අර්ථසාධක අරමුදල් ගෙවීමට නියමිතව ඇත. මෙම අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී එම ප්‍රමාණවල් අඩු කර ගැනීමට කටයුතු කර ඇත. දැනට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් උපදෙස් පතමින් සිටින්නේ ඒවා ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් ගිණුම්වලින් නැවත අයකර ගැනීම පිළිබඳවයි.

g. මෙය, අවශ්‍යතා සඳහා පාවිච්චි කර ඇති අතර මහා භාණ්ඩාගාරයෙන් අවුරුද්ද අවසාන කාලයේදී මූල්‍යාධාර නිදහස් කරනු ලබයි. මහා භාණ්ඩාගාරයෙන් අවුරුද්ද කාලයේදී 2011 වර්ෂයේ 321,500,000 වන ප්‍රාග්ධනයෙන් 181,500,000 (56% ප්‍රාග්ධන ආධාර) ලැබී ඇත්තේ වසර අවසාන කාලයේදීය. එම විස්තර පහත පරිදි වේ.

| *දිනය* | *මුළු මුදල (රුපියල්)* |
|---|---|
| 2011.11.08 | 56,500,000 |
| 2011.12.21 | 25,000,000 |
| 2011.12.30 | 100,000,000 |
| | 181,500,000 |

h. අත්තිකාරම් පියවීම පිළිබඳ අදාළ පිටපත් අමුණා ඇත. ඇමුණුම්වලට අදාළව 2012 දී අත්තිකාරම් පියවා ඇත. (ඇමුණුම් 3)

2.2.4 පහත දැක්වෙන ආකාරයට සිදුකර ඇත.

| | *අයිතමය* | *වටිනාකම (රුපියල්)* | *ක්‍රියා මාර්ගය* |
|---|---|---|---|
| i. | ඉඩම් සහ ගොඩනැගිලි | 7,84,834,257 | මෙම කටයුතු පිටතට දීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් සිටී |
| ii. | ඉඩම් | 28,994,672 | |
| iii. | අර්ධ - ස්ථිර ව්‍යාපෘති | 5,500,000 | |
| iv. | කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ | 105,542,983 | |
| v. | පුස්තකාල පොත් හා වාර සඟරා | 2,048,447 | සිදුවෙමින් පවතී |
| vi. | මෝටර් රථ | 6,135,545 | මෙම කටයුතු පිටතට දීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් සිටී |
| vii. | ලෝගු | 2,986,216 | වාර්ෂික පිරික්සුම් දැනටමත් සිදුකර ඇත. |
| viii. | දුරකථන හුවමාරුව | 1,606,086 | ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ ඉංජිනේරුවන් විසින් වාර්ෂික පිරික්සුම් සිදු කරනු ලැබ ඇති අතර එය භාවිතයට නොගැළපේ. |
| ix | යන්ත්‍ර සූත්‍ර | 3,721,839 | මෙම ගැටලු නිරාකරණය කිරීම සඳහා වෙළඳ සමාගම් තෝරාගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. වැඩි දුරටත් ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ඇත. |
| x. | විවිධ ණයගැතියෝ | 2,156,033 | |
| xi. | සිසුන්ට ණය හා අත්තිකාරම් | 1,835 | විස්තර කාර්ය ලේඛනයේ දක්වා ඇති අතර වයස් පිළිබඳ විශ්ලේෂණ ඉදිරියේදී ලබා දෙනු ඇත. |
| xii. | වෙනත් | 27,825,191 | |
| xiii. | ගිවිසුම් ප්‍රකාර ලැබීම් | 110,144,526 | |
| xiv. | විවිධ ණය හිමියෝ | 9,491,490 | |
| xv. | වෙනත් | 20,305,670 | |
| xvi. | ගෘහ භාණ්ඩ ලේඛනය | 15,416,915 | විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. |
| xvii. | ණය සහ සේවක අත්තිකාරම් | 99,923,816 | විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. |
| viii. | සුළු පරිමාණ අළුත්වැඩියා කිරීම් (වාහන) | 2,629,071 | |
| xix. | සුළු පරිමාණ අළුත්වැඩියා කිරීම් (යන්ත්‍ර සූත්‍ර) | 2,758,787 | |
| xx. | සුළු පරිමාණ අලුත්වැඩියා කිරීම් (ගොඩනැගිලි හා ව්‍යුහ නිර්මාණ) | 5,277,796 | |
| xxi. | ඉන්ධන හා ලිහිසි තෙල් | 4,531,617 | විගණනය සඳහා ඉදිරිපත් කර ඇත |
| xxii. | ගෙවල් කුලී | 5,423,654 | |
| xiii. | විදුලි සංදේශන | 12,203,038 | |
| xiv. | කෙරීගෙන යන මූලික වැඩ කටයුතු | 59,408,750 | |
| xxv. | ගෙවිය යුතු වියදම් | 3,237,223 | විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. |
| xvi. | උපචිත සඳහා වෙන්කිරීම් වච්නියා මණ්ඩපය | 927,161 | විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. |

b. වාර්තාවේ සඳහන් ලේඛන නියමිත කාලය තුළ සපයනු ඇත.

2.2.5 සටහන් කරගත් අතර ඉදිරියේ දී ඒ අනුව කටයුතු කරන්නෙමු.

3.1.2 ප්‍රදේශයේ පවතින සාමාන්‍ය තත්ත්වය නිසා විශ්ව විද්‍යාලයේ අධ්‍යයන සහ පරිපාලන කටයුතු ව්‍යාප්ත වීම හා වර්ධනය වීම සිදු වී ඇති අතර නූතන සන්නිවේදන පහසුකම්වල දියුණු වීම මේ සඳහා බෙහෙවින් ඉවහල් වී ඇත. සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් මාර්ග පද්ධතිය පුළුල් කිරීමට සිදුවීම නිසා කාර්යාලීය වේලාවන් තුළ නිරන්තර විදුලිය ඇණ හිටීම් සිදු වූ අතර මේ තත්ත්වය සෘජු දුරකථන මාර්ග භාවිතා කිරීම කෙරෙහි හේතු විය.

b. මුල්‍ය බදු ක්‍රමය යටතේ විශ්වවිද්‍යාලය වාහන 03 (වෑන් රථ 02 ක් හා කැබ් රථයක්) ලබාගෙන ඇති අතර මේවා බොහෝ විට දුර ගමන් සඳහා යොදා ගනු ලබයි. නිලධාරීන් හට ඇතැම් සාකච්ඡා සඳහා නිරන්තරයෙන් කොළඹට කැඳවීමේදී පවතින වාහන දේශීය ප්‍රවාහනය සඳහා යොදාගනු ලැබීම හේතුවෙන් කුලී වාහන ලබාගැනීම අත්‍යවශ්‍ය විය.

c. මාස 09 ක් සඳහා වන විදුලි ගාස්තු අය කිරීම රුපියල් 26,253.26ක් වන අතර එහි සාමාන්‍ය මාසික ගණනය රුපියල් 2917,029 කි. මෙම වසරේ මුල් මාස 03 තුළ ගණනය නොකළේ නම් සාමාන්‍ය අය කර ගැනීම මෙයට වඩා බෙහෙවින් අඩු වනු ඇත. 2011 අප්‍රේල් මාසයේදී තොරතුරු තාක්ෂණ ඉංජිනේරුවන් හා කම්කරුවන් විසින් එහි නැවතී සිටි සියලු කටයුතු අවසන් කර ඇත. එකී ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා SIDA ගිවිසුම යටතේ සේවයේ නියුතු පුද්ගලයින් නොමිලයේ නවාතැන්, විදුලිය හා අනෙකුත් පොදු පහසුකම් ලබාදීම සඳහා වන එකඟතාවය සඳහා විශ්වවිද්‍යාලය අත්සන් තබා ඇත.

ඔවුහු සිය නවාතැන් කාලසීමාව තුළ විදුලි උපකරණ පාවිච්චි කර ඇති අතර එම කාලය තුළ විදුලි ගාස්තු ඉහළ යාම සඳහා එය හේතු වී ඇත. විශ්ව විද්‍යාලයට මෙම තත්ත්වය දැනුම් දීමෙන් අනතුරුව ලංකා විදුලිබල මණ්ඩලය මගින් මෙම තත්ත්වය නිවැරදි කරන ලද බැවින් මෙම කරුණ පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයෙන් විමසා තහවුරු කර ගත හැකිය. එසේම අමුත්තන් සඳහා වන නිවාස වලින් මූලික විදුලි නඩත්තු ගාස්තු පමණක් අඩුකර ගැනීමට අපේක්ෂා කරන අතර වෙනත් විශේෂ/පරිබාහිර වියදම් එයට අදාළ නැත. ලේඛකාධිකාරීවරයා, සිය තනතුරට අදාළව නිල නිවාස සඳහා හිමිකම් ලැබූ අතර උපකුලපතිවරයාගේ අනුමැතිය සහිතව ඉහත සඳහන් කරන ලද භූමි පරිශ්‍රයේ නවාතැන් පහසුකම් ලබාගන්නා ලදී.

d. ආරාධිත දේශන, තේරීම් මණ්ඩල ආදිය සඳහා පැමිණෙන ලද අමුත්තන්හට නවාතැන් පහසුකම් සැපයීමේදී අපි බොහෝ දුෂ්කරතාවයන් අත් දකින්නෙමු. මනා පහසුකම්වලින් සමන්විත අමුත්තන් සඳහා වන නිවාසවල අවශ්‍යතාවය දිගු කලක පටන් පැවතුණි. එම නිවාස සඳහා ලබා දී ඇති වායු සමීකරණ පහසුකම් හා වැසිකිලි පහසුකම් යනාදිය අපගේ ඉල්ලීම හා ආරාධනය පරිදි විශේෂ රැස්වීම් හා නිල උත්සව සඳහා පැමිණෙනු ලබන අමුත්තන් සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවන තත්ත්වයක් පවතී. ඔවුන් ඉහත සඳහන් කළ පහසුකම් අපේක්ෂා කිරීම නිසා ඔවුන් සඳහා නවාතැන් පිටත ස්ථානවලින් සැපයීමට අපට සිදුවී ඇත.

3.1.3 මෙම කටයුතු බැහැරින් ලබා ගනියි.

3.1.4 (අ) කවුන්සිලයේ අවසර ඇතිව ජංගම ගිණුමෙහි පවත්නා අතිරික්ත මුදල් ස්ථාවර තැන්පත් සඳහා ආයෝජනය කරන ලද අනුමත කරන ලදී. අනුමත කරන ලද ප්‍රධාන ව්‍යාපෘති වියදම් කිරීමට මුදල් නොමැති වීම හේතුවෙන්ම නව ව්‍යාපෘති සඳහා ඉක්මනින් අරමුදල් නිදහස් කිරීම හේතුවෙන් අතිරික්ත අරමුදල් වියදම් කිරීමට සිදු විය.

පවරා දෙනු ලැබූ අරමුදල් හා සමාන පරිත්‍යාගවලින් ලැබුණු මුදල් ආයෝජනය කිරීම් මගින් ලැබෙනෙ පොළිය කුමක් වුවත් ඒ පරිත්‍යාගකරුවන්ගෙන් අපේක්ෂිත අරමුණු ලඟා කරගැනීම සඳහා ප්‍රයෝජනයට ගනු ලැබේ.

3.1.5

i හා ii

කෘෂිකර්ම පීඨය කිලිනොච්චි ප්‍රදේශයේ ආරම්භ කිරීමත් සමග අත් ට්‍රැක්ටර් භාවිත කළ හැකි අතර අනෙකුත් වාහන විශ්වවිද්‍යාලයේ භාවිතය සඳහා යොදා ගැනුණි. ගබඩාවන්හි ඇති භාණ්ඩ භාවිතයට ගතහැකි සහ යල්පැන ගිය භාණ්ඩ වර්ග කළ අතර යල් පැන ගිය භාණ්ඩ සම්බන්ධයෙන් 2013 වසරේ කටයුතු කරමින් පවතී.

iii. නව චක්‍රලේඛ අනුව යමින් ඇඟිලි සලකුණු යන්ත්‍ර දැනටමත් ස්ථාපනය කර ඇති අතර කාලය සටහන් කිරීමේ යන්ත්‍ර ගර්හිත හා පාවිච්චියට ගත නොහැකි අයිතම ලෙස සලකනු ලැබේ.

iv. මෑතකදී කුලියට ගත් නිවාස සඳහා සමහර ඇඳන් දැනටමත් ලබා දී ඇති අතර ඉතිරි ඇඳන් කෘෂිකර්ම හා ඉංජිනේරු නේවාසිකාගාරයන් සඳහා පැමිණෙන නවක සිසුන් සඳහා යැවීමට කටයුතු සම්පාදනය කර ඇත.

v. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ විද්‍යුත් විද්‍යාගාර ආරම්භයත් සමග සියලු පරිගණක භාවිතයට ගන්නා ලදී. මේ සියල්ල වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨ යටතට ගැනේ.

3.1.6 (i)

කොළඹ එල් එල් බී සිසුන් සඳහා සිව්වැනි වසර අධ්‍යයන වැඩසටහන පැවැත්වීමට විශ්ව විද්‍යාල සෙනට් මණ්ඩලය තීරණය කරන ලද අතර එහි ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව සලකා බලනු ලැබීය.

(1) අධ්‍යයන ඒකක 30 කින් සමන්විත ලකුණු 30 ක අගයක් ලබාදෙන පර්යේෂණ ව්‍යාපෘති වලින් සිව්වැනි වසර වැඩසටහන සමන්විත වේ.

(2) නීතිපීඨයේ මීළඟ අධ්‍යයන වර්ෂයේ ඉගැන්වීම් කටයුතු පවත්වාගෙන යාම සඳහා එක් ස්ථිර කථිකාචාර්යවරයෙකු පමණක් ලබා ගත හැකි වීම.

(3) යාපනය විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ කොළඹ ශාඛාවේ සිව්වෙනි වසර සිසුන් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, තමිල්වරන් මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 එස්. සේගරාජසිංහම් මහත්මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1, සිවාපනම්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 සහ ඒ සර්වේස්වරන් මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 යන අය දේශන භාර ගැනීමට සූදානමින් සිටී. ඔවුනට දැනට පවතින වැඩ අධික බව සහ යාපනයට ගමන් කිරීමේදී පවතින දුෂ්කරතා නිසා නීති පීඨයේ කොළඹ ශාඛාවේ සිවුවැනි වසර සිසුනට දේශන පැවැත්වීමට ඔවුහු වඩාත් කැමැත්තක් දක්වයි.

(ii) විශ්ව විද්‍යාලය පද්ධතියේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම සටහන් කිරීම සඳහා පැමිණීමේ ලේඛන භාවිතා නොකරන අතර ඒ පිළිබඳ කවුන්සලය වෙත දැනුම් දුන් අතර ඒ පිළිබඳ ක්‍රියාමාර්ගයක් යථා කාලයේදී ගැනීමට නියමිතය.

